සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021(2022)

# 25A - ඉන්දියා ඉතිහාසය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Department of Examinations - Sri Lanka

Department of Examinations - Sri Lanka

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021(2022)

## 25A - ඉන්දීය ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

**I පත්‍රය** = 01 x 40 = 40

**II පත්‍රය**

| | | |
|---|---|---|
| අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 18 |
| සෙසු ප්‍රශ්න03 කට 14 බැගින් | = | 42 |
| II පත්‍රය අවසාන ලකුණු | = | 60 |

**අවසාන ලකුණු = 40 + 60 = 100**

Department of Examinations - Sri Lanka

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ................................................ √ △ 4/5

(ii) ................................................ √ △ 3/5

(iii) ................................................ √ △ 3/5

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Department of Examinations - Sri Lanka

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)**
**General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)**

ඉන්දිය ඉතිහාසය II (I කොටස)
இந்திய வரலாறு II (பகுதி I)
History of India II (Part I)

**25 A S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**ඉන්දිය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

විභාග අංකය: ..................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
* කොටස් දෙකට ම මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II** කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

* අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් සවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ. එම නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

1. (1) කිර්තාර් (2) සුලෙයිමාන් (3) බයිබර්
   (4) හින්දුකුෂ් (5) කාරකෝරම් (......)

2. (1) කාවේරි (2) සට්ලෙජ් (3) රාවි
   (4) චේනාබ් (5) ජේලම් (......)

3. (1) විශාඛදත්ත (2) ශුද්‍රක (3) වරාහමිහිර
   (4) දණ්ඩින් (5) ආර්යභට (......)

4. (1) දන්තිදුර්ග (2) පළමුවැනි ක්‍රිෂ්ණ (3) දෙවැනි ගෝවින්ද
   (4) වරගුණවර්මන් (5) ධ්‍රැව (......)

5. (1) මහබලිපුරම් (2) භාරූත් (3) සාංචි
   (4) අමරාවතී (5) නාගර්ජුනිකොණ්ඩ (......)

6. (1) වලනාඩු (2) මණ්ඩලම් (3) පංචායත්
   (4) නාඩු (5) කුර්රම් (......)

7. (1) කෝසල (2) අංග (3) මගධ
   (4) වජ්ජි (5) වත්ස (......)

8. (1) චන්ද්‍රගුප්ත මෞර්ය (2) පුෂ්‍යමිත්‍ර (3) බින්දුසාර
   (4) අශෝක (5) කුනාල (......)

9. (1) නාගර්ජුන (2) නිගණ්ඨනාථපුත්‍ර (3) පූර්ණකාශ්‍යප
(4) මක්ඛලි ගෝසාල (5) අජිත කේශකම්බල (.....)

10. (1) බ්‍රෝච් (2) තානා (3) මුල්තාන්
(4) ප්‍රතිෂ්ඨාන් (5) දෙබාල් (.....)

● අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නො ගැළපේ. එම නො ගැළපෙන යුගලය කුමක් දැ යි හඳුනාගෙන, ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. (1) මහබලිපුරම් හි පංචරථ දේවාල - පල්ලව
(2) බදාමියෙහි විෂ්ණු දේවාලය - චාලුක්‍ය
(3) තන්ජෝරයේ බෘහදේශ්වර දේවාලය - පාණ්ඩ්‍ය
(4) බේලූර්හි චෙන්නකේශව දේවාලය - හොයිසාල
(5) එල්ලෝරාහි කයිලාසනාථ දේවාලය - රාෂ්ට්‍රකූට (.....)

12. (1) විෂ්ණුගෝප - වෙංගි
(2) මහේන්ද්‍ර - කෝසල
(3) ව්‍යාඝ්‍රරාජ - මහාකාන්තාර
(4) උග්‍රසේන - පල්ලක්ක
(5) දමන - එරන්ඩපල්ල (.....)

13. (1) දේවගිරි - යාදව
(2) ද්වාරසමුද්‍ර - හොයිසාල
(3) කල්‍යාණි - බටහිර චාලුක්‍ය
(4) වරංගල් - කාකතීය
(5) මදුරෙයි - පල්ලව (.....)

14. (1) වික්‍රමාදිත්‍ය - දෙවැනි චන්ද්‍රගුප්ත
(2) මදුරෙයි කොණ්ඩ - පරාන්තක
(3) සකල උත්තරාපථනාථ - හර්ෂ
(4) වාතාපිකොණ්ඩ - වරගුණවර්මන්
(5) පරමේශ්වර - දෙවැනි පුලකේශින් (.....)

15. (1) නර්මදා - භාරුකච්ඡ
(2) තප්ති - කල්‍යාණි
(3) යමුනා - මථුරා
(4) ගංගා - කනෞජ්
(5) ගෝදාවරී - ප්‍රතිෂ්ඨාන් (.....)

● අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරවල දී ඇත. Y තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරය X තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

| | X | | Y |
|---|---|---|---|
| 16. (i) | අශ්වඝෝෂ | A | සමුද්‍රගුප්ත |
| (ii) | හරිසේන | B | හර්ෂ |
| (iii) | ෆාහියන් | C | කණිෂ්ක |
| (iv) | භාණභට්ට | D | දෙවැනි නරසිංහවර්මන් |
| (v) | දණ්ඩින් | E | දෙවැනි චන්ද්‍රගුප්ත |

(1) AEBCD (2) BCDEA (3) CAEBD (4) DEBCA (5) EBCDA (.....)

Department of Examinations - Sri Lanka

| | X | | Y |
|---|---|---|---|
| **17.** (i) | ප්‍රියදර්ශිකා | A | වරාහමිහිර |
| (ii) | බෘහත්සංහිතා | B | සෝමදේව |
| (iii) | කථාසරිත්සාගර | C | ආර්යභට්ට |
| (iv) | සූර්ය සිද්ධාන්ත | D | කල්හණ |
| (v) | රාජතරංගිනී | E | හර්ෂ |

(1) BDCEA (2) CEDBA (3) DCEAB (4) EABCD (5) EACBD (......)

| | X | | Y |
|---|---|---|---|
| **18.** (i) | මහිසමණ්ඩල | A | මහාධර්මරක්ඛිත |
| (ii) | මහාරට්ඨ | B | සෝන සහ උත්තර |
| (iii) | හිමවන්ත | C | මජ්ඣන්තික |
| (iv) | සුවණ්ණභූමි | D | මහාදේව |
| (v) | කාශ්මීර-ගන්ධාර | E | මජ්ඣිම |

(1) ABDCE (2) BCDEA (3) CADBE (4) DAEBC (5) DEBAC (......)

| | X | | Y |
|---|---|---|---|
| **19.** (i) | චණ්ඩප්පජ්ජෝත | A | පල්ලව |
| (ii) | බින්දුසාර | B | මෞර්ය |
| (iii) | සිමුක | C | අවන්ති |
| (iv) | ස්කන්ධවර්මන් | D | චාලුක්‍ය |
| (v) | දෙවැනි පුලකේශින් | E | සාතවාහන |

(1) CBEAD (2) CAEBD (3) CDBAE (4) DBCAE (5) EABCD (......)

| | X | | Y |
|---|---|---|---|
| **20.** (i) | ශ්‍රී මාර ශ්‍රී වල්ලභ | A | රුහුණට පලාගිය පස්වැනි මිහිඳු අල්ලා ගැනීම |
| (ii) | පරාන්තක | B | I සේන රජුගේ කාලයෙහි දී ශ්‍රී ලංකාව ආක්‍රමණය කොට අනුරාධපුරය කොල්ල කෑම |
| (iii) | පළමුවැනි රාජරාජ | C | චෝළයින් ශ්‍රී ලංකාවෙන් පළවා හැරීම |
| (iv) | පළමුවැනි රාජේන්ද්‍ර | D | පස්වැනි මිහිඳු රජුගේ කාලයෙහි දී අනුරාධපුරය අල්ලා ගැනීම |
| (v) | පළමුවැනි කුලෝත්තුංග | E | පාණ්ඩ්‍ය කකුධභාණ්ඩ නැවත ලබාගැනීම පිණිස අනුරාධපුරය ආක්‍රමණය කිරීම |

(1) ACBDE (2) BEDAC (3) CDEBA (4) EBCDA (5) ECDAB (......)

● අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ. එය තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**21.** පසු වෛදික යුගය

(1) සංචාරක දිවිපෙවෙතක සිට ස්ථිර පදිංචිය සහිත කෘෂි ජීවිතය කරා සංක්‍රාන්ති සමයක් වීම.
(2) පීතෘ මූලික විස්තෘත පවුල් ව්‍යුහයක් නැගී ඒම.
(3) පවුල් සමූහයක එකතුවෙන් ග්‍රාමයක් සකස් වීම.
(4) රාජන් නමැති නායකයෙකු යටතේ ගෝත්‍රය පැවතුණි.
(5) පූජකයෙකු විසින් පවත්වනු ලබන යාග ප්‍රධාන ආගමික කටයුත්ත වීම. (......)

**22.** මහා ඇලෙක්සැන්ඩර්

(1) ඇලෙක්සැන්ඩර් හින්දුකුෂ් තරණය කොට ක්‍රිස්තු පූර්ව 327 දී ඉන්දියාවට ඇතුළු විය.
(2) ඔහුගේ හමුදා බියස් නදිය තෙක් සාර්ථකව ගමන් කිරීමට සමත් විය.
(3) නන්ද හමුදාවට බියෙන් ඇලෙක්සැන්ඩර්ගේ හමුදාව බියස් නදියෙන් ඔබ්බට ගමන් කිරීම ප්‍රතික්ෂේප කළේය.
(4) ඇලෙක්සැන්ඩර්ගේ හමුදා හා තක්ෂිලාවේ රජු අතර ඉතා බලවත් යුද්ධයක් ඇති විණි.
(5) ඔහුගේ ආසියානු අධිරාජ්‍යයේ අනුප්‍රාප්තිකයා බවට පත් වූයේ සේනාපති සෙලියුකස් නිකේටර් ය. (......)

Department of Examinations - Sri Lanka

**23. සුංග පෙළපත**

(1) බෘහද්‍රථ රජුගේ හමුදා ප්‍රධානියා වූ පුෂ්‍යමිත්‍ර නම රජු මරා දමා සිහසුනට පත්විය.
(2) පුෂ්‍යමිත්‍ර විසින් පිහිටුවන ලද පෙළපත සුංග නමින් හැඳින්වේ.
(3) මගධ අධිරාජ්‍යයේ බිඳියාම නතර කළ පුෂ්‍යමිත්‍ර විදේශීය ආක්‍රමණවලින් රට ආරක්ෂා කිරීමට සමත් විය.
(4) අවසන් සුංග පාලකයා සිහසුනෙන් පළවා හැරි වාසුදේව නම් ඇමතිවරයා කාන්ව පෙළපත පිහිටුවීය.
(5) ඉතා භක්තිමත් බ්‍රාහ්මණගාමික පිරිසක් වූ සුංගයෝ කිසිවිටෙකත් අනෙකුත් ආගම් නොඉවසූහ. (......)

**24. කාලිංගය**

(1) දරුණු සටනකින් කාලිංගය ජය ගැනීමෙන් පසුව අශෝක රජු බුද්ධාගම වැළඳගත් බව විශ්වාස කෙරේ.
(2) තෝසලී අගනුවර කොටගත් කාලිංගය මෞර්ය අධිරාජ්‍යයේ පාලන ඒකකයක් විය.
(3) ඛාරවේලගේ නායකත්වය යටතේ මෞර්ය ආධිපත්‍යයෙන් කාලිංගය යළි නිදහස ලබා ගත්තේ ය.
(4) හථිගුම්පා සෙල්ලිපියෙන් ඛාරවේලගේ ජයග්‍රහණ පිළිබඳ තොරතුරු ලබා දෙයි.
(5) ඛාරවේල චේදි වංශයට අයත් විය. (......)

**25. පළමුවන චන්ද්‍රගුප්ත**

(1) ශ්‍රී ගුප්තගේ මුණුපුරා වූ පළමුවැනි චන්ද්‍රගුප්ත ගුප්ත අධිරාජ්‍ය පිහිටුවීමට මුල් වූ පාලකයා ලෙසට සලකනු ලැබේ.
(2) ලිච්ඡවී කුමාර දේවිය විවාහ කර ගැනීමෙන් පළමුවන චන්ද්‍රගුප්ත තම රාජධානිය විශාල කර ගත්තේ ය.
(3) පළමුවන චන්ද්‍රගුප්ත තමාගේ මෙන්ම තම දේවියගේ නමින් ද හවුලේ කාසි නිකුත් කළේ ය.
(4) මහා රාජාධිරාජ යන විරුදය පළමුවන චන්ද්‍රගුප්ත දැරුවේ ය.
(5) පළමුවන චන්ද්‍රගුප්ත ඉන්දියාව ආක්‍රමණය කළ හූනයන් සාර්ථක ලෙස පළවා හැරියේය. (......)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් .................................................. 1 ද
(A) සහ (C) පමණක් නිවැරදි නම් .................................................. 2 ද
(B) සහ (C) පමණක් නිවැරදි නම් .................................................. 3 ද
(C) සහ (D) පමණක් නිවැරදි නම් .................................................. 4 ද
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ............... 5 ද **වරහන තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. වෛදික සාහිත්‍යය**

(A) වේද යන පදයේ අර්ථය දැනුම යන්න ය.
(B) චතුර්වේදය, බ්‍රාහ්මණ, ආරණ්‍යක සහ උපනිෂද් යන ග්‍රන්ථවලින් වෛදික සාහිත්‍යය සමන්විත වේ.
(C) ඍග්වේදය ලෝකයේ පැරණිතම ආගමික ග්‍රන්ථය වශයෙන් සලකනු ලැබේ.
(D) වේදය ඉදිරියට ගෙනගියේ මුඛ පරම්පරාවෙනි. (......)

**27. වර්ධමාන මහාවීරතුමා**

(A) එතුමා බුදුන් වහන්සේගේ සමකාලීනයෙකු විය.
(B) එතුමා ජෛනාගමෙහි පළමු තීර්ථංකර වූයේ ය.
(C) වේදයෙහි එන ඉගැන්වීම් එතුමා ප්‍රතික්ෂේප කළේ ය.
(D) එතුමා කර්මය විශ්වාස කළේ නැත. (......)

Department of Examinations - Sri Lanka

**28. චන්ද්‍රගුප්ත මෞර්ය හා සෙලියුකස් නිකේටර් අතර ඇති වූ සම්මුතිය**

(A) හින්දුකුෂ් කරණය කළ චන්ද්‍රගුප්ත මෞර්ය, සෙලියුකස් නිකේටර් පරාජය කළේ ය.
(B) මෞර්ය රාජසභාවට මෙගස්තිනීයස් එවීමෙන් නිකේටර් තම මිත්‍රත්වය තහවුරු කළේ ය.
(C) හින්දුකුෂ්වලින් ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල පාලනය ගෙනයාමට නිකේටර්ට ඉඩ සැලසුණි.
(D) පරාජයෙන් පසුව නිකේටර් විසින් ජයග්‍රාහී චන්ද්‍රගුප්ත මෞර්ය රජුට හස්තීන් 500 ත්‍යාග කරන ලදී (......)

**29. රාෂ්ට්‍රකූටයෝ**

(A) චාලුක්‍ය රජ වූ කීර්තිවර්මන් රජු පරාජය කළ, දන්තිදුර්ග ඩෙකානයෙහි රාෂ්ට්‍රකූට රාජධානිය පිහිටුවිය.
(B) ඉතා දැඩි ජෛන භක්තිකයින් පිරිසක් වූ රාෂ්ට්‍රකූටයෝ තම රාජධානිය තුළදී ශෛව සහ වෛෂ්ණව ආගම් නොඉවසූහ.
(C) ත්‍රෛයිකෝණික අරගලයට සහභාගි වූ පළමු රාෂ්ට්‍රකූට පාලකයා ධ්‍රැවයේ ධ්‍රැව යි.
(D) පළමුවන පරන්තක නම් චෝළ රජු විසින් ඩෙකානයේ පැවැති රාෂ්ට්‍රකූට බලය අවසන් කිරීමට සමත් විය.(......)

**30. සමුද්‍රගුප්ත**

(A) සිහසුනට පත් වූ වහාම දක්ෂිණාපථයේ රාජධානි 12ක් සමුද්‍රගුප්ත අත්පත් කර ගත්තේ ය.
(B) මෙසේ අල්ලාගත් දක්ෂිණාපථයේ රාජධානි සමුද්‍රගුප්ත සිය අධිරාජ්‍යයට සෘජුව ඈඳා ගත්තේ ය.
(C) සමුද්‍රගුප්තගේ යුද ව්‍යාපාරය ශීර්ෂ හතරක් යටතේ අලහබාද් ප්‍රශස්තියෙහි විස්තර කර තිබේ.
(D) ශ්‍රී ලංකාවේ රජු සමුද්‍රගුප්ත රජුට අවනතභාවය දැක්වූ පාලකයින් අතුරෙන් කෙනෙකි. (......)

● අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**31.** ආර්යාවර්තයෙහි දකුණු සීමාව ලෙසට සලකන ලද්දේ කුමක් ද?

(1) සත්පුර (2) වින්ධ්‍යා (3) නීල්ගිරි
(4) අරවල්ලි (5) බැහෙරෝඩා (......)

**32.** මිලින්ද පඤ්හ ග්‍රන්ථයේ කතුවරයා කවරෙකු ද?

(1) අශ්වඝෝෂ (2) වසුබන්ධු (3) නාගර්ජුන
(4) නාගසේන (5) බුද්ධඝෝෂ (......)

**33.** චාලුක්‍ය පෙළපතේ පළමුවැනි පුලකේශින්ගේ අගනගරය කුමක් ද?

(1) වෙංගි (2) කල්‍යාණි (3) වාතාපි
(4) ප්‍රතිෂ්ඨාන (5) වරංගල් (......)

**34.** "මුම්මුඩිචෝළදේව" යන ගෞරව නාමයෙන් හඳුන්වන ලද්දේ කවරෙක් ද?

(1) පරන්තක (2) පළමුවැනි රාජරාජ (3) පළමුවැනි රාජේන්ද්‍ර
(4) පළමුවැනි කුලෝත්තුංග (5) පළමුවැනි රාජාධිරාජ (......)

**35.** ශ්‍රී ලාංකේය හමුදා ඉන්දියානු භූමියේ දී චෝළයින් විසින් පරාජය කළ බවට සඳහන් වන අභිලේඛනය කුමක්ද?

(1) ආර්පාක්කම් (2) චිදම්බරම් (3) තිරුමලෙයි
(4) රාමේශ්වරම් (5) උත්තරමේරූර් (......)



Department of Examinations - Sri Lanka

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා, ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | ඍග්වේදයට අනුව පුරන්දර දෙවියන් හරයුපියා නගරය විනාශ කළේ ය. | වෛදික ජනයාගේ යුද්ධයට අධිපති දෙවියන් ඉන්ද්‍ර යනුවෙන් හැඳින්වේ. | (......) |
| **37.** | මිනැන්ඩර් ඉන්දු-ග්‍රීක රජවරු අතුරෙන් වැදගත් කෙනෙකු විය. | ග්‍රීක වාර්තා අනුව මිනැන්ඩර්ගේ අගනුවර පුරුෂපුරය විය. | (......) |
| **38.** | හර්ෂ රජුගේ කාලයෙහි දී ෆාහියන් හිමි ඉන්දියාවට පැමිණියේ ය. | ෆාහියන් හිමි නාලන්දා විශ්ව විද්‍යාලයෙහි බුදු දහම හැදෑරූහ. | (......) |
| **39.** | සාතවාහනයින්ගෙන් පසුව පාණ්ඩ්‍යයෝ ඩෙකානයෙහි බලයට පත් වූහ. | ග්‍රීක මූලාශ්‍රවලට අනුව පාණ්ඩ්‍ය රජෙකු විසින් එවන ලද දූත පිරිසක් ජූලියස් නම් රෝම රජු විසින් පිළිගෙන තිබේ. | (......) |
| **40.** | 'මත්තවිලාශ ප්‍රහසනය' වනාහි පල්ලව සමයේ ආගමික ගැටුම් හා ආගමික ජීවිතය දක්වන හාස්‍යෝත්පාදක නාට්‍යයකි. | බිමත් කපිල නම් තාපසයකු සහ නාගසේන නම් බෞද්ධ භික්ෂුව අතර ඇති වූ වාදය ඇතුළත් වන අතිශය හාස්‍යජනක මත්තවිලාශ ප්‍රහසනය කෙටි ඒකාංගික සංස්කෘත නාට්‍යයකි. | (......) |

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021(2022)

විෂය අංකය / பாட இலக்கம்: 25 A
විෂයය / பாடம்: ඉන්දීය ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 5 | 31. | 2 |
| 02. | 1 | 12. | 1 | 22. | 4 | 32. | 4 |
| 03. | 4 | 13. | 5 | 23. | 5 | 33. | 3 |
| 04. | 4 | 14. | 4 | 24. | 3 | 34. | 3 |
| 05. | 1 | 15. | 2 | 25. | 5 | 35. | 1 |
| 06. | 3 | 16. | 3 | 26. | 5 | 36. | 2 |
| 07. | 4 | 17. | 4 | 27. | 2 | 37. | 1 |
| 08. | 2 | 18. | 4 | 28. | 3 | 38. | 3 |
| 09. | 1 | 19. | 1 | 29. | 2 | 39. | 4 |
| 10. | 4 | 20. | 2 | 30. | 4 | 40. | 5 |

○ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 1 x 40 = 40

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ඉන්දීය ඉතිහාසය II (II කොටස)
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

**25 A** **S** **II**

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

**උපදෙස්:**

* පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නයටත්, B හා C කොටස්වලින් එක ප්‍රශ්නය බැගින් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
(පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) රූපාර් | (ii) තාම්‍රලිප්ති
(iii) බෝලාන් | (iv) හින්දුකුෂ්
(v) මථුරා | (vi) සත්පුර
(vii) ජූනාගාඩ් | (viii) උජ්ජේනි
(ix) ප්‍රතිෂ්ඨාන් | (x) කන්පෝර්
(xi) සුප්පාරක | (xii) ගෝදාවරී

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

## B කොටස

2. ඉන්දියානු ඉතිහාසය හැඩගැසීමෙහිලා ව්‍යාවහාරික තත්ත්ව බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 16යි)

3. පුරාතන ඉන්දියාවේ ආගමික විශ්වාස සහ පූජා විධි පහත දැක්වෙන තේමා යටතේ විචාරාත්මකව විග්‍රහ කරන්න.

(i) ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස හා පූජා විධි (ලකුණු 08යි)
(ii) පසු වෛදික වැසියන්ගේ ආගමික විශ්වාස හා පූජා විධි (ලකුණු 08යි)

4. "උතුරු ඉන්දියාවේ මුල් ම අධිරාජ්‍ය නිර්මාපකයෝ මෞර්යයෝ වූහ."

(i) මෞර්ය අධිරාජ්‍යයෙහි සමාරම්භකයා ලෙසට සැලකෙන්නේ කවරෙක් ද? (ලකුණු 01යි)
(ii) මෞර්ය අධිරාජ්‍යය ගැන තොරතුරු ලබාදෙන ප්‍රධාන සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02යි)
(iii) මෞර්යයන්ගේ මධ්‍ය හා ප්‍රාදේශීය පරිපාලනය සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි)
(iv) මෞර්ය අධිරාජ්‍යයේ ක්‍රමික ව්‍යාප්තිය පරීක්ෂා කරන්න. (ලකුණු 09යි)

5. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) හරප්පා වැසියන්ගේ නගර සැලසුම්කරණය
(ii) සොළොස් මහා ජනපද
(iii) ඉන්දු-ග්‍රීකයෝ
(iv) මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳවැටීම. (ලකුණු 08 × 2 = 16යි)

Department of Examinations - Sri Lanka

## C කොටස

6. ඉන්දියානු ඉතිහාසයෙහිලා කුෂාණ යුගයේ වැදගත්කම පහත දැක්වෙන ක්ෂේත්‍ර ඔස්සේ පරීක්ෂා කරන්න.

   (i) ආගම හා සාහිත්‍යය (ලකුණු 08යි.)

   (ii) කලා හා ගෘහනිර්මාණ ශිල්පය (ලකුණු 08යි.)

7. "ගුප්ත අධිරාජ්‍ය සමය ඉන්දියානු ඉතිහාසයෙහි සම්භාව්‍ය අවධියක් ලෙස සලකනු ලැබේ."

   (i) ගුප්ත යුගයේ නිල හා සාහිත්‍යමය භාෂාව කුමක් ද? (ලකුණු 01යි.)

   (ii) ගුප්ත සමයේ පැවැති ප්‍රධාන හින්දු ආගමික ශාඛා දෙක නම් කරන්න. (ලකුණු 02යි.)

   (iii) ගුප්ත සමයේ කලා ක්ෂේත්‍රයන්හි සිදුවී ඇති වර්ධනය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04යි.)

   (iv) ගුප්ත අධිරාජ්‍ය සමය ඉන්දියානු ඉතිහාසයේ සම්භාව්‍යමය අවධියක් ලෙසට සැලකිය හැකි වන්නේ කවර හේතු නිසාදැයි පැහැදන්න. (ලකුණු 09යි.)

8. "හර්ෂ දක්ෂ සටන්කාමියෙකු මෙන්ම හොඳ පරිපාලකයෙක් ද විය." මෙම ප්‍රකාශය පහත සඳහන් තේමා ඔස්සේ සාකච්ඡා කරන්න.

   (i) උතුරු ඉන්දියාවේ අධිරාජ්‍යයක් පිහිටුවීම (ලකුණු 08යි.)

   (ii) හර්ෂ රජුගේ සමාජ හා ආගමික කටයුතු (ලකුණු 08යි.)

9. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   (i) හියුංසාං

   (ii) ත්‍රිකෝණ අරගලය

   (iii) චෝලයන්ගේ ප්‍රාදේශීය පාලනය

   (iv) පාල රාජවංශය (ලකුණු 08 × 2 = 16යි.)

* * *



Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| ඉන්දීය ඉතිහාසය II<br>இந்திய வரலாறு II<br>History of India II | 25 A | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................



Department of Examinations - Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය – 2021(2022)

## ඉතිහාසය II (II කොටස)

## ඉන්දීය ඉතිහාසය – අතීත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

උපදෙස්:

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නයටත්, B හා C කොටස්වලින් අවම වශයෙන් එක ප්‍රශ්නය බැගින් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

(පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)

### A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) රූපාර්  (ii) තාම්‍රලිප්ති

(iii) බෝලාන්  (iv) හින්දුකුෂ්

(v) මථුරා  (vi) සත්පුර

(vii) ජුනාගාඩ්  (viii) උජ්ජේනි

(ix) ප්‍රතිෂ්ඨාන්  (x) තන්ජෝර්

(xi) සුප්පාරක  (xii) ගෝදාවරී

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)*



Department of Examinations - Sri Lanka

## B කොටස

**02. ඉන්දියානු ඉතිහාසය හැඩගැසීමෙහිලා වයඹදිග කපොලු බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න.**

- ඇෆ්ඝන් කඳු, සුලෙයිමාන්, කිර්තාර් හා හින්දුකුෂ් කඳු මුල් කරගෙන ඉන්දියාවේ වයඹ කපොලු මාර්ග පිහිටා ඇත.
- මෙහිදි ඛයිබර්, බෝලාන් හා මක්‍රාන් ප්‍රධාන තැනක් ගෙන ඇත. මේ අතුරිනුත් ඛයිබර් කපොල්ල මුල් තැනක් ගෙන ඇත.

  ඛයිබර් දුර්ග මාර්ගය (කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවර් දක්වා වැටී ඇත)

  බෝලාන් දුර්ග මාර්ගය (ඛයිබර් දුර්ගයට දකුණින් සුලෙයිමාන් කඳුවලට බටහිරින් පිහිටා ඇත)

  මක්‍රාන් දුර්ග මාර්ගය ( බෝලාන් දුර්ගයට සැතපුම් 300 පමණ දකුණට වන්නට කිර්තාර් කඳු හා අරාබි මුහුද අතර පිහිට ඇත )

  හේරාත් දුර්ග මාර්ගය (ඇෆ්ඝන් කඳු ආශ්‍රිත ප්‍රදේශයේ සිට සිංධු ගංගා නිම්නය දක්වා )

- බටහිර හා මධ්‍ය ආසියාවත් ඉන්දියාවත් අතර සම්බන්ධතාවය තහවුරු කරනු ලැබුවේත් ඉන්දියාව බටහිර ලෝකය සමග සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබුවේත් මෙම දුර්ග මාර්ග ඔස්සේ ය.
- මේ ඔස්සේ ඉන්දියාවට සංක්‍රමණය වූ මුල් ජනපදිකයන් ඉන්දියාවේ දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන අංශයන්හි පරිවර්තනයක් ඇති කිරීම.
- ග්‍රීක, ශක, පාර්තියන්, කුෂාණ, හූණ, අරාබි,තුර්කි හා මෝගල් වැනි විවිධ විජාතික ජන කණ්ඩායම් ඉන්දියාවට පිවිසීම හා දේශපාලන ආධිපත්‍යයක් ගොඩනගා ගැනීම.( කයිබර් හරහා ආර්යයන්, පළමුවන ඩේරියස්, ඇලෙක්සැන්ඩර්, ඝස්නි මහමුද්, බාබුර්; බෝලාන් හරහා ශකවරු, ඝෝර්හි මොහම්මද් ; මක්‍රාන් හරහා ඇලෙක්සැන්ඩර් ආපසු යෑම)
- ඉන්දියානු දේශපාලන ආධිපත්‍යය මෙන්ම ආගම්, සංස්කෘතිය හා දර්ශනය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්තවීම.
- ඉන්දියාවෙන් පිටත මධ්‍ය ආසියාව, චීනය දක්වා බුදුදහම ව්‍යාප්තවීම සහ මධ්‍ය ආසියාවේ බෞද්ධ මධ්‍යස්ථාන ආරම්භවීම.
- ග්‍රීක, ඉස්ලාම් හා මෝගල් ගෘහ නිර්මාණ ශිල්පක්‍රම, චිත්‍ර කලාව හා මූර්ති කලාව වැනි සංස්කෘතිකාංවලින් ඉන්දියානු ඉතිහාසය පෝෂණයවීම.
- චීනය, මධ්‍ය ආසියාව, පර්සියාව, ග්‍රීසිය, අරාබිය වැනි පෙර අපර දෙදිග රටවල් සමග වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගෙන යෑම මගින් වාණිජ රටාවේ ප්‍රබල වර්ධනයක් ඇතිවීම.
- දුර්ග මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණි දේශ ගවේශකයන් සමකාලීන ඉන්දියානු ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය කර තිබීම. ( මෙගස්තිනිස්, ඵාහියං, හියුංත්සාං)
- වයඹ කපොලු ආරක්ෂා කරගැනීමට ඉන්දියානු පාලකයන් කෙතෙක් උත්සාහ දැරුව ද ඉතිහාසය පුරාම වයඹදිග දුර්ග මාර්ග අනාරක්ෂිතව පැවතීම ඉන්දියානු ඉතිහාසය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කර තිබීම.

***(ලකුණු 16යි)***



Department of Examinations - Sri Lanka

**03. පුරාතන ඉන්දියාවේ ආගමික විශ්වාස සහ පූජා විධි පහත දක්වෙන තේමා යටතේ විචාරාත්මකව විග්‍රහ කරන්න**

**(i) ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස සහ පූජා විධි**
**(ii) ඍග් වෛදික වැසියන්ගේ ආගමික විශ්වාස සහ පූජා විධි**

**(i) ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස සහ පූජා විධි**

- ශිෂ්ටාචාරයේ හමු වී ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව ආගමික විශ්වාස රැසක් තිබූ බවට හඳුනා ගැනීම. (ජගත් මාතා වන්දනය, පශුපත් වන්දනය, ජල වන්දනය, සත්ත්ව වන්දනය, ලිංග වන්දනය, ගිනි දෙවියා පිදීම, සූර්ය දේව වන්දනය, මළවුන් පිදීම, අං පිදීම)

- ජගත් මාතා වන්දනය (මව් දෙවඟන)
  - ➢ මව් දෙවඟන යයි සැලකෙන ටෙරාකොටා මූර්ති 2000 කට වඩා හමු වී තිබීම.
  - ➢ සශ්‍රිකත්වයේ දෙවඟන ලෙස සලකා වන්දනාමාන කළ බව.
  - ➢ විශ්වයේ හා භූමියේ දෙවඟන ලෙස ජගත් මාතා වන්දනය කළ බව.
  - ➢ විවිධ ඉරියව් වලින් යුත් කාන්තා ප්‍රතිමා ජගත් මාතාව ලෙස සලකා වන්දනා කළ බව.
  - ➢ ඇතැම් කාන්තාවන් පාලන කාර්යයෙහි යෙදුනු බවට විශ්වාස කිරීම.

- පශුපති වන්දනාව
  - ➢ පශුපති ලෙස සැලකෙන සතුන් පිරිවරා ගත් මූර්තියක් ලැබී තිබීම.(අංග සහිත හිස් වැස්මක් පැළඳ සිටීම)
  - ➢ මහා භාවනායෝගී ස්වරූපයකින් ත්‍රිශූලධාරීව සිටීම.
  - ➢ පසුකාලීන හින්දූන්ගේ "ශිව" දෙවිඳුන්ගේ පූර්ව රූපය ලෙස සැලකිය හැකි බව.

- වෘක්ෂ වන්දනාව
  - ➢ වෘක්ෂයට හෝ වෘක්ෂයන්ට අධිපති දෙවිවරුන් සිටිතැයි විශ්වාසයෙන් යුතුව වන්දනා කළ බව. ( ඇසතු, නුග යන ශාකයන්ට වන්දනා කළ බවට සාක්ෂි හමුවීම)
- ජල වන්දනය
  - ➢ ශිෂ්ටාචරයේ සියලුම වැසියන් ජලයට ගෞරව දැක්වූ බව.
  - ➢ මොහෙන්ජොදාරෝවේ ස්නානාගාරය ජල වන්දනය සඳහා යොදාගත් බවට විශ්වාස කෙරේ.

- ලිංග හා යෝනි වන්දනාව
  - ➢ කැනීම්වලදී මතුකරගත් සමහර ගල් කැබලි ලිංග ආකාර ස්වරූපයෙන් දක්නට ලැබීම.

- සත්ත්ව වන්දනාව
  - ➢ විවිධ ආභරණවලින් සරසන ලද මොල්ලිය සහිත ගව රූපය දුම් වැදී කලු වී තිබීම.
  - ➢ ගවයා පූජනීයත්වයෙන් සැලකීම.
  - ➢ මනඃකල්පිත කගවේනා රූපය / නාගයා වන්දනාවට පාත්‍ර වී ඇති බව.
  - ➢ යන්ත්‍ර මන්ත්‍ර විශ්වාස ද ඔවුන්ගේ ඇදහිලි අතර තිබෙන්නට ඇති බවට සාධක ලැබේ.

- පැහැදිලිවම වැදුම් පිදුම් කළ පූජ්‍යස්ථානයක් සේ සැලකිය හැකි ගොඩනැගිල්ලක් තවමත් හමු නැත.

***(ලකුණු 08 යි)***



Department of Examinations - Sri Lanka

**(ii) සෑග් වෛදික වැසියන්ගේ ආගමික විශ්වාස සහ පූජා විධි**

- සෑග් වෛදික යුගයේ බහු දේවවාදී ආගමික සංකල්ප දක්නට ලැබීම.
- ස්වභාව ධර්මයේ විවිධ වස්තූන්ට හා බලවේගයන්ට දේවත්වයක් ආරෝපනය කර වන්දනා කිරීම.
- දෙවියන් අතර වඩාත් වැදගත් වූයේ වරුණ දෙවියාය. ඉන්ද්‍ර හා ප්‍රජාපති සෙසු වැගත් දෙවිවරු විය.
- මෙම දෙවිවරු ප්‍රධාන කොටස් තුනකට බෙදා තිබීම
  - ➢ ආකාශ - වරුණ, චිත්‍ර , සාවිත්‍රි, පූෂාන්, සූර්ය, විශ්ණු, උෂා
  - ➢ අන්තරීක්ෂ - ඉන්ද්‍ර, රෞද්‍ර, වායු, පර්ජන්‍ය
  - ➢ පෘථිවි - අග්නි, සෝම, බ්‍රහස්පති , ගංගා
- මෙම එක් එක් දෙවියා ස්වභාව ධර්මයේ විවිධ අංග නියෝජනය කිරීම. ඉන්ද්‍ර:- ශක්තිය, වැස්ස, මේඝ ගර්ජනා යානදියට අධිපති, වරුණ:- ජලයට අධිපති හා ශාක හා සත්ත්ව පත්වාගෙන යාමට, අග්නි:- ගින්නට අධිපති, යම- : මරණයට අධිපති, සූර්ය:- දවසට අධිපති, පෘථිවි: පොළවට අධිපති, උෂා-: උදෑසනට අධිපති, සෝම-: සඳු දෙවියා ය.
- දෙවියන් සතුටු කිරීමට කිරි, ගිතෙල් හා තවත් ආහාර වර්ග ගින්නට දැමීමෙ පූජා විධි මෙන් ම ගවයන්, අසුන් ආදි සතුන් බිලිදීමේ යාග ද පවත්වා ඇත.
- බොහෝ දෙවිවරුන්ට පූජා කරන ජනප්‍රිය පූජා ද්‍රව්‍යයක් සෝමපානය සෝම දෙවි ලෙස ද වන්දනයට පාත්‍ර වීම.
- බොහෝ දෙවිවරු යහපත් ක්‍රියාවන්ට ආරූඪ කොට තිබීම රුද්‍ර පමණක් අයහපතට ආරූඪ කර තිබීම.
- වෛදික දෙවිවරුන්ට පිදීමට සෑග් වේදයේ ස්තෝත්‍ර ගීතිකා 1028 කට වැඩි ප්‍රමාණයක් තිබීම.
- යඥය “ ගෘහ යාග” ලෙස ආරම්භ වීම.
- ගෘහ මූලිකයා පවුලේ සියල්ලන් සමඟ වේද ගීතිකා ගයමින් දෙවියන්ට කිරි, සෝම පැලෑටියේ යුෂ පූජා කිරීම.
- අග්නි දෙවියා දෙවියන් සහ මිනිසුන් සම්බන්ධ කළ අතරමැදි දෙවියා වීම.
- මෙම ආගමික සංකල්ප පශ්චාත් වෛදික යුගය වනවිට තවදුරටත් විකාශනය වීම.

***(ලකුණු 08යි)***

**04. “උතුරු ඉන්දියාවේ මුල් ම අධිරාජ්‍ය නිර්මාපකයෝ මෞර්යයෝ වූහ.”**

**(i) මෞර්ය අධිරාජ්‍යයෙහි සමාරම්භකයා පාලනය කළ රජ පෙළපත නම් කරන්න.**

චන්ද්‍රගුප්ත මෞර්ය රජු

***(ලකුණු 01යි)***



Department of Examinations - Sri Lanka

**(ii) මෞර්ය අධිරාජ්‍ය ගැන තොරතුරු ලබාදෙන ප්‍රධාන සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න**

පුරාණ ග්‍රන්ථ, මහා කාව්‍ය, රාජ තරංගනිය, දිව්‍යාවදානය, අර්ථ ශාස්ත්‍රය, ජෛන ග්‍රන්ථ මෙගස්තිනීස්, ස්ට්‍රාබෝ, ඩයඩෝරස්, ප්ලීනි, ඒරියන්, ජස්ටින් වැනි බටහිර ලේඛකයන්ගේ වාර්තා ලංකාවේ දීපවංසය, මහාවංසය, මහාවංසටීකාව, මහා බෝධිවංසය

***(ලකුණු 02යි)***

**(iii) මෞර්යයන්ගේ මධ්‍ය හා ප්‍රාදේශීය පරිපාලනය සැකෙවින් දක්වන්න.**

මූලාශ්‍රගත තොරතුරු අනුව මෞර්ය පාලනය මධ්‍ය පාලනය හා ප්‍රාදේශීය පාලනය ලෙස ප්‍රධාන කොටස් දෙකකි.

**මධ්‍ය පාලනය**

- රාජාණ්ඩු ක්‍රමයක් පැවතිම. රජු පරිපාලනයේ ප්‍රධානියා වීම හා ඉහළම තනතුරු දැරීම. රාජ්‍යත්වය පාරම්පරිකව පියාගෙන් පුතාට හිමිවීම. රජුට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන සියලු බලතල හිමිවීම. අර්ථශාස්ත්‍රයෙහි රජුට පැවරෙන කටයුතු පිළිබඳව සඳහන් වේ.
- රජුට අසීමිත බලයක් පැවතිම, අණපනත් පැනවීම, ඒවා ක්‍රියාත්මක කරවීම හා ප්‍රචාරය කරවීම, රාජානුශාසනා නිකුත් කිරීම, බදු නියම කිරීම, අධිකරණ කටයුතු සංවිධානය කිරීම, විදේශ සබඳතා පැවැත්වීම, උසස් නිලධාරීන් පත් කිරීම, චතුරංගනී සේනා සංවිධානය කිරීම හා රටේ කෘෂිකාර්මික, ආගමික, සංස්කෘතික දියුණුව ඇති කිරීම.
- රජුට සහයට මන්ත්‍රී පර්ෂදයක් ද විය. එය ඇමැතිවරුන්ගේ උපදේශක සභාවකි.
- රජුට සහාය වූ නිලධාරීන් පිරිසකි - (උපරාජ . බොහෝ විට මේ තනතුර රජුගේ පුතා දැරිය, උප රජුට පහළ නිලධාරීන් රැසක් සිටීම. අශෝක රජුගේ පළමුවන ටැම් ලිපියේ පුරුෂ (රාජ පුරුෂ) නමින් මොවුන් හඳුන්වා ඇත. මොවුන් කොටස් තුනකි.

    1. ඉහළ ගණයේ නිලධාරීන් (උතස)
    2. මධ්‍යම ගණයේ නිලධාරීන් ( මර්ධම)
    3. පහළ ගණයේ නිලධාරීන් (හේවය)

- විවිධ කාර්යයන් භාරව සිටි අමාත්‍ය, මහාමාත්‍ය, අධ්‍යක්ෂ, සහ ඔවුන් යටතේ වූ නිලධාරි මණ්ඩලයක් විය.
- ඉහළ ගණයේ නිලධාරීන් යුවරජු, පුරෝහිත ,අග්‍රාමාත්‍ය සහ සේනාපති.
- මෞර්ය පාලනය තුළ කෞටිල්‍ය විසින් පුරෝහිත හා අග්‍රාමාත්‍ය යන තනතුරු දෙකම ඉසිලීය.
- පුරෝහිත තනතුරට නිශ්චිතවම බ්‍රාහ්මණ වංශිකයෙක් තෝරා ගැනීම.(ඔහුගේ කාර්යය අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කිරීම, රජ පවුලේ සාමාජිකයන් වෙනුවෙන් ආගමික උත්සව සහ පුද පූජා පැවැත්වීම)
- සේනාපති (අග්‍රාමාත්‍ය තනතුරට සමාන බලයක් හිමි වීම, රජුට ඉතා කිට්ටු විශ්වාසවන්ත පුද්ගලයෙක් තෝරා ගැනීම,අභ්‍යන්තර හා බාහිර තර්ජන වලින් රට ආරක්ෂා කිරීම, චතුරංගනී සේනාව පවත්වා ගැනීම, සේනාවට නායකත්වය දීම, සාමය පත්වාගෙන යාම සිදු කිරීම)
- ඉහත සඳහන් නිළධාරීන්ට අමතරව මධ්‍යම ගණයේ නිලධාරීන් 6 දෙනෙක් සිටීම. (භාණ්ඩාගාරික (සන්නිධර්ති),ප්‍රධාන අයකැමි (සමාහර්තා), අන්තඃපුර පාලක (අන්තඃවශික), බලකොටුභාර නිලධාරි (දුර්ගපාල), දේශසීමා ආරක්ෂක (අන්තපාල), නගර අධ්‍යක්ෂ (නාගරික),

Department of Examinations - Sri Lanka

- මහාමාත්‍ර නම් නිලධාරීන් පිරිසක් ද පත් කර තිබීම.( ධර්මමහාමාත්‍ර, අන්තමහාමාත්‍ර :දේශසීමා, ඉත්තිජක මහාමත්‍ර :කාන්තා සුභසාධනය)
- පහළ ගණයේ නිලධාරීන් - යුක්තක (යුත) (වසර 5ක වරක් රට පුරා සංචාරය කර පර්ෂදයේ නියෝග ක්‍රියාත්මක කිරීම, ලේඛක (ලිපිකරු) ලිපි ලේඛන භාරවීම, දූත (දූත) (රජයේ නියෝග වෙනත් ප්‍රදේශ වලට ගෙන යාම, පටිවේදක (ප්‍රතිවේදක) රාජ්‍ය තුළ සිදුවන විවිධ මහජන කටයුතු සහ පැනවෙන අණපනත් පිළිබඳව ක්‍ෂණික වාර්තා රජු වෙත සැපයීම)
- චර පුරුෂ සේවය පවත්වාගෙන යාම. (සමස්ථාන්, සන්චරාහ්)
- චතුරංගනී සේනාවක් ද සිටීම.

**ප්‍රාදේශීය පාලනය**

- මෞර්ය අධිරාජ්‍යය මධ්‍යම ආණ්ඩුවෙන් පාලනය වුයේ අගනුවර අවට ප්‍රදේශයන්ය.
- අනෙකුත් ප්‍රදේශ පාලනයේ පහසුව සඳහා ප්‍රත්‍යන්ත ජනපද හතරකට බෙදා තිබීම (ස්වර්ණගිරි, උදේනි, තෝසලි, තක්ෂිලා) ඒවා පාලනය කුමාරවරුන් හෝ රජ පවුලේ පිරිස් විසින් සිදු කිරීම.
- ප්‍රාන්ත පාලනය කළ කුමාරවරුන්ට ද මධ්‍ය පාලනය හා සමාන නිලධාරී මණ්ඩලයක සහය ලැබිණි.
- විශාල ප්‍රාන්ත කොටස්වලට බෙදා ප්‍රාදේශික, රජුක, යුක්ත යන නිළධාරීන් විසින් පාලනය කරන ලදී.
- ප්‍රත්‍යන්ත ජනපද නැවත රාෂ්ට්‍ර හෙවත් දිස්ත්‍රික්ක ලෙස ද, රාෂ්ට්‍ර නැවත ගම් දහස, ගම් සියය, ගම් විස්ස, ගම් දහය හා පස්ගම් වශයෙන් කුඩා කුඩා ඒකකවලට බෙදා තිබීම. ඊට අමතරව පොකුරු ගම් ද වීම. (800 :ස්ථානික, 400 :ද්‍රෝණමුඛ, 200: කාර්වටික, 100: සංග්‍රහන)
- මෞර්ය පාලනයේ කුඩාම පරිපාලන ඒකකය ගම වීය. ග්‍රාමීය ප්‍රදේශ වල නඩු විසඳීම සඳහා ග්‍රාම කූට නම් නිලධාරියෙකු පත් කර තිබීම.
- මෞස්තීනිස්ට අනුව පාටලිපුත්‍ර නගර පාලයට විවිධ ක්ෂේත්‍ර සඳහා පිහිට වූ සාමාජිකයන් 5 දෙනෙකුගෙන් යුත් මණ්ඩල 6 ක් මගින් සිදු කරන ලදී.

***(ලකුණු 04 යි)***

Department of Examinations - Sri Lanka

**(iv) මෞර්ය අධිරාජ්‍යයේ ක්‍රමික ව්‍යාප්තිය පරීක්ෂා කරන්න**

- මෞර්ය අධිරාජ්‍යයේ ව්‍යාප්තිය විවිධ සාහිත්‍ය මූලාශ්‍රය සහ පුරාවිද්‍යා මූලාශ්‍රය තුළින් හඳුනාගත හැකිවීම.
- චන්ද්‍රගුප්ත මෞර්ය, බින්දුසාර, අශෝක යන රජවරුන් අධිරාජ්‍ය ව්‍යාප්තියට දායක වීම.
- චන්ද්‍රගුප්ත මෞර්ය යටතේ අධිරාජ්‍ය ව්‍යාප්ති විය.
    - ➢ නන්දවරුන්ගෙන් මගධය මුදා ගැනීම.
    - ➢ වයඹදිග ඉන්දියාව ග්‍රීක ආධිපත්‍යයෙන් මුදවා ගැනීම.
    - ➢ සෙලියුකස් නිකේටර් පරාජය කිරීම සහ ගිවිසුමක් අත්සන් කිරීම.
    - ➢ ඒ අනුව හිරාත්, කන්දහාර්, කාබුල්, බලුකිස්ථාන් චන්ද්‍රගුප්තට පවරා ගැනීම.
    - ➢ පර්සියාව දක්වා බලය ව්‍යාපත් වීම.
    - ➢ සෞරාෂ්ට්‍රය දක්වා බලය පැතිර තිබූ බව සෞරාෂ්ට්‍රයේ යටත් පාලකයා ලෙස පුෂ්‍යගුප්ත වෛශ්‍ය නම් අයකු කටයුතු කිරීමෙන් පැහැදිලි වීම.
    - ➢ පුෂ්‍යගුප්ත විසින් සුදර්ශන වැව කරවූ බව ජුනගාද් ලිපියේ සඳහන් වීම.
    - ➢ චන්ද්‍රගුප්තගේ බලය මයිසෝරය දක්වා තිබූ බව මයිසූර් ශිලා ලිපියක සඳහන් වීම.
    - ➢ ඉන්දියාවේ ප්‍රථම, විශාලම අධිරාජ්‍යය ගොඩනැගීමේ ගෞරවය චන්ද්‍රගුප්ත මෞර්යට හිමිවේ.
- බින්දුසාරගේ රාජ්‍ය සමය
    - ➢ කෞටිල්‍ය සමඟ එක්ව පාලකයන් කීප දෙනෙකුගේ නගර 16ක බලය බිඳ ලූ බව ටිබෙට් මූලාශ්‍රවල සඳහන් වීම.
    - ➢ බින්දුසාර රාජ්‍ය සමයේදී තක්ෂිලාවේ කැරැල්ලක් මැඩලීම සඳහා අශෝක යැවූ බව සඳහන්වීම හා පසුව උජ්ජේනියට පැමිණ යුව රජු ලෙස ක්‍රියා කිරීම.
- අශෝක රජු යටතේ අධිරාජ්‍යයේ ව්‍යාප්තිය.
    - ➢ අශෝක සුසීම ඝාතනය කර ක්‍රි. පූ. 269 දී පාටලීපුත්‍රයේ බලයට පත් වීම.
    - ➢ රාජ්‍යත්වයෙන් අටවන රාජ වර්ෂයේදී කාලිංග දේශය යටත් කිරීම ( 13 වන ගිරි ලිපිය)
    - ➢ කාලිංගය ජය ගැනීමෙන් පසුව මෞර්ය අධිරාජ්‍යයේ සීමාව උතුරින් හිමාලය දක්වාත්, නැගෙනහිර දෙසින් ඇසෑමය හා වෙරළ තීරය දක්වාත්, ගිණිකොන සීමාව - බෙංගාලය දක්වාත්, දකුණුනින් කාවේරි නදිය හා අවට ප්‍රදේශය ද, බටහිර සීමාව - අරාබි මුහුදේ වෙරළ තීරය හා වයඹ සීමාව - ගාන්ධාර හා පුරුෂපුර දක්වාත් පැතිරීම.
- චන්ද්‍රගුප්ත මෞර්යගෙන් ආරම්භ වූ මෞර්ය අධිරාජ්‍ය අශෝක රජුගේ රාජ්‍ය කාලය වනවිට ඉතා විශාල ප්‍රදේශයක බලය ව්‍යාප්ත වී ගොස් තිබිණි.

*(ලකුණු 09යි.)*

Department of Examinations - Sri Lanka

**05. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.**

**(i) හරප්පා වැසියන්ගේ නගර සැලසුම්කරණය**

- උපයෝගිතාවයට මුල්තැන දෙමින් පූර්ව සැලැස්මකට අනුව නගර සැලසුම් කිරීම.
- නගර සැලසුමේදී, සෑම නගරයකටම පොදු සමානාත්මතාවයකින් යුතුව සැලසුම් කිරීම.
- මහල් සහිත ගොඩනැගිලි නිර්මාණය කිරීම.
- ඇතැම් නිවාසවල විවෘත මැද මිදුලක් දක්නට තිබීම.
- නාන කාමර ඇතුලු වෙනත් සෞඛ්‍ය පහසුකම්වලින් යුක්ත වීම.
- නගර සැලසුමේදී ඇතුල් නුවර හා පිටි නුවර ලෙස කොටස් දෙකකින් සමන්විත වීම.
- ඇතුල් නුවර ගොඩනැගිලි උස් වේදිකාවක් මත ඉදිකර තිබීම. එය පරිපාලන මධ්‍යස්ථානය ලෙස භාවිතා කිරීම.
- නගරය වටා මුර අට්ටාල සහිත ප්‍රාකාරය ඉදිකර තිබීම. බලකොටු ස්වරූපයක් දැකිය හැකිවීම.
- ආයතචතුරාශ්‍රාකාර සැලැස්මකට අනුව නගර ඉදිකිරීම.
- විශාල නගර ඇතුළත පුළුල් මංමාවත් නිර්මාණය කිරීම හා එම මාර්ග සැලසුම් සහගත රේඛානුකූලව විහිදුනු මාර්ග පද්ධතියක් වීම
- ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රධාන වශයෙන් ගඩොල් භාවිතා කිරීම. (පිලිස්සූ හා හිරු එළියෙන් වේලා ගත් )
- වීථි නිර්මාණය සෘජු කෝණාශ්‍රාකාර අයුරින් සිදු කර තිබීම.
- දියුණු සෞඛ්‍ය හා සනීපාරක්ෂක ක්‍රම භාවිතා කරමින් මනා ජලප්‍රවාහන හා මළ ප්‍රවාහන පද්ධතියක් සකස් කර තිබීම.
- ප්‍රධාන මාවත්වලට දෙපසින් විහිදී ගිය කාණු පද්ධතියක් ඉදිකර තිබීම.
- සෞඛ්‍ය සම්පන්න බවට මුල් තැන දෙමින් නගර සැලැසුම් කිරීම.

➢ නිවාස පද්ධතිය, ඇතුළු නගරය, මොහෙන්ජොදාරෝවේ ස්නානාගාරය, හරප්පාවේ ධාන්‍යාගාරය, වීථි ආලෝක කුලුණු, රබිගාර්හි විශාල ස්නානාගාරය වැනි අංශවලින් නාගරික ලක්‍ෂණ පෙන්නුම් කිරීම.

***(ලකුණු 08 යි)***

**(ii) සොළොස් මහා ජනපද**

- ග්‍රාමීය ශ්‍රෝත්‍රිකත්වයෙන් මිදී ජනපද තත්ත්වය කරා යාමෙන් ජනපද 16ක් ඇතිවීම සොළොස් මහා ජනපද ලෙස හැඳින්වේ.
- මේ පිළිබඳව තොරතුරු බෞද්ධ, ජෛන හා බ්‍රාහ්මණ ග්‍රන්ථවල සඳහන් වේ.
- බෞද්ධ මූලාශ්‍රයක් වන අංගුත්තර නිකයේ ජනපද 16ක් පැවති බව සඳහන් වේ.
  අංග, මගධ, කාසි, කෝසල , වජ්ජි, මල්ල , චේදි, වත්ස්‍ය, පංචාල , කුරු, සූරසේන, අස්මක, අවන්ති, ගාන්ධාර, කාම්බෝජ
- සොළොස් මහා ජනපද තුළ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම දෙක වූයේ රාජාණ්ඩු පාලන ක්‍රමය හා සමූහාණ්ඩු පාලන ක්‍රමය (ගණ රාජ්‍ය) යි.

Department of Examinations - Sri Lanka

## රාජාණ්ඩු පාලනයේ ලක්ෂණ

- සොළොස් මහ ජනපද අතරින් ප්‍රධාන රාජාණ්ඩු 4ක් දක්නට ලැබේ. මගධ , කෝසල , වත්ස, අවන්ති ( මේවා චතුර් මහා විජිතයන් ලෙස හැඳින්වේ)
- රාජාණ්ඩු පාලනයේ රජු ප්‍රධානියා විය.
- විධායක, ව්‍යවස්ථාදායක, අධිකරණ යන අංශ තුනේම බලය රජු සතුවීම. නමුත් මන්ත්‍රී පර්ෂදය මඟින් රජුගේ බලය සීමා වීම.
- ඇත්, අස් , රිය, පාබල යන අංශවලින් යුක්ත හමුදාවක් සිටීම.
- මත්ස්‍ය න්‍යාය හා විවාහ සබඳතා භාවිත කරමින් ප්‍රධාන රාජ්‍ය 4 විසින් අනෙක් රාජ්‍ය යටත් කරගනු ලැබීම.
- අවසානයේ මගධය සියලු ජනපද අභිබවා නැඟී සිටීම.
- මගධයේ භූගෝලීය බලපෑම ද මෙයට හේතු විය.

## සමූහාණ්ඩු පාලනය (ගණ රාජ්‍ය පාලනය)

- සමූහාණ්ඩු පාලනයේදී වජ්ජි හා මල්ල කැපී පෙනෙන සමූහාණ්ඩු වේ.
- බෞද්ධ සාහිත්‍යයේ ගණ රාජ්‍ය 9 ක් පිළිබඳව සඳහන් වේ. (කපිලවස්තුවේ ශාක්‍යයන්, වෛශාලියේ ලිච්ඡවීන්, මිථිලාවේ විදේහයන්,රාමග්‍රාමයේ කෝලියවරුන්, කුසිනාරාහි පාවාහි මල්ලයන්, අල්ලකප්පයේ බුලිවරු (බුල්ලිවරු), කේසපුත්තයේ කාලාමයන්, පිප්ඵලීවනයේ මෝරියවරුන්, සුංසුමාරගිරියේ භග්ගයන් )
- මේවායේ රාජ්‍ය ප්‍රධානීන් ගණපති, ගණ ජ්‍යෙෂ්ඨ හා ගණ රාජන් යන නම් වලින් හැඳින්වේ.
- මෙහි පාලනය නියෝජිතයන් රැසකගෙන් සැදුම්ලත් විධායක සභාවක් මඟින් සිදුවිය.
- ලිච්ඡවී සමූහාණ්ඩුවේ රජවරු 7707 ක් සිටි බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.
- පාලක මණ්ඩලය රැස් වූ ශාලාව "සන්ථාගාර"(කූටාගාර ශාලා) නම් විය.
- පාලන ප්‍රතිපත්ති සප්ත අපරිහානිය ධර්ම නම් ආචාර ධර්ම හතක් අනුව සැකසී තිබිණි.
- බුදුරාජාණන් වහන්සේ පවා වජ්ජි රාජ්‍යයේ පැවති සප්ත අපරිහානි ධර්ම අගය කළහ.
- "ප්‍රවේණි පුස්තකය" අනුව රාජ්‍යයේ අධිකරණ කටයුතු සිදුකරනු ලබයි.
- ගණ රාජ්‍ය මුලිනුපුටා දැමීම චන්ද්‍රගුප්ත මෞර්ය රාජ සමයේ සිදු විය.

***(ලකුණු 08 යි)***



Department of Examinations - Sri Lanka

## (iii) ඉන්දු -ග්‍රීකයෝ

- මෞර්ය අධිරාජ්‍යය අවසාන කාලයේ සිට ග්‍රීකයන් වරින් වර ඉන්දියාවට පැමිණි අතර පශ්චාත් මෞර්ය යුගයේදී ඉන්දියාවේ පැවති දේශපාලන අස්ථාවරත්වය මත ඔවුන් ඉන්දියාව ආක්‍රමණය කිරීම.
- සිරියාවේ ඇන්ටියෝකස් රජු හින්දුකුස් කඳුවැටිය තරණය කර කාබුල් නිම්නයට ඇතුල් වී සුභගසේන රජුගෙන් කප්පම් ලෙස ඇත් හමුදාවක් ලබාගැනීම හා පංජාබය හා බටහිර ඉන්දියාවේ ප්‍රදේශ කීපයක් අල්ලා ගැනීම.
- ඩිමෙට්‍රියස් එල්ල කළ ආක්‍රමණයෙන් පංචාල හා සාගල අල්ලා ගැනීම.
- මිනැන්ඩර්ගේ ආක්‍රමණයෙන් ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් අත්පත් කරගැනීම. (මොහු සියල්කෝට් (සාගල,සාකල) අගනුවර කරගනිමින් ගංගා නම් නදියේ සිට ඔක්සස් නදී නිම්නය දක්වාත් හිමාලයේ සිට නර්මදා නදිය තෙක් ද බලය පැතිරවීම.
- මිනැන්ඩර්ගෙන් පසුව ග්‍රීක බලය පරිහානියට පත් වූ අතර එයින් පසු ග්‍රීක පාලකයන් වූයේ යුක්‍රටයිඩ්ස් හා හර්මයියෝස් ය.
- මිත්‍රඩේටස් නම් පාර්තීය රජු විසින් හර්මයියෝස් පරාජයට පත් කරන ලදි.
- මිනැන්ඩර් රජු බුදුදහමට අනුග්‍රහ දැක්වීම.
- මිනැන්ඩර් රජුට අයත් කාසි විශාල ප්‍රමාණයක් හමු වී තිබීම ( තක්ෂිලා, පෙෂාවෝර්, රාවල්පිණ්ඩි).

***(ලකුණු 08 යි)***

## (iv) මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳවැටීම

- මෞර්ය පාලන සමය චන්ද්‍රගුප්ත මෞර්යයගෙන් ආරම්භ වී බෘහද්රථ මරා පුෂ්‍යමිත්‍ර ශුංග බලය ලබා ගැනීමත් සමඟ අවසන් විය.
- සුංග වංශය බලය ලබා ගැනීම මෞර්ය පෙළපත බ්‍රාහ්මණ විරෝධී ප්‍රතිපත්තියක් ගෙන ගිය බවට මතයක් ඉදිරිපත් වීම.
- අශෝක රජු අනුගමනය කළ ආගමික ප්‍රතිපත්ති. (බුද්ධාගමට විශේෂ සැලකිල්ලක් දක්වමින් බ්‍රාහ්මණ විරෝධි ප්‍රත්පත්තියක් අනුගමනය කිරීම නිසා බ්‍රාහ්මණයින් රාජ්‍ය විරෝධීව කටයුතු කළ බවට අදහසක් පැවතීම ).
- අශෝක රජු අනුගමනය කළ අවිහිංසාවාදී ප්‍රතිපත්තිය.
- මෞර්යයන් මිත්‍යා විශ්වාස හා යාග හෝමවලට විරෝධය දැක්වීම.
- මෞර්යයන් බ්‍රාහ්මණවාදයට පහර එල්ල නොකලත් බ්‍රාහ්මණයින්ට අන් ආගමිකයන්ට මෙන් සමානව සැලකීම තම ඉහල තත්ත්වය අගය නොකිරීමක් සේ සලකන්නට වීම.

මෙම කරුණුවලට අමතරව මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීම තවත් කරුණු හේතු වී ඇත.

- අශෝක රජුගෙන් පසු කේන්ද්‍රගත පාලනය බිඳවැටීම හා දුර්වල පාලකයන් බලයට පත්වීමත් සමග රාජ්‍ය බලය අඩපණ වීම.
- අතිශයින් විමධ්‍යගත වූ දේශපාලන නිලබලය කේන්ද්‍රගත වීම.මෙය සාර්ථක කර ගැනීමට හැකි වූයේ දක්ෂ පාලකයින්ට පමණි.
- ප්‍රතිරජවරු තම අභිමතය පරිදි නිලධාරීන් තෝරා ගැනීම නිසා පසුකාලීනව ඔවුන් මහත් බලයක් අත්පත් කර ගැනීම.
- ඉඩම් හිමියන්, වාණිජ ප්‍රජාව, නිලධාරීන් වැනි විවිධ ශ්‍රේණි තම කටයුතු ස්වාධීනය කරගෙන යාමට උත්සාහ දැරීම.
- පාලන තන්ත්‍රයේ ගැටුම් ඇතිවීම. ( රාජ සභාව තුළ, ප්‍රාන්ත රාජ්‍යවල.)
- අධිරාජ්‍යයේ විශාලත්වය.
- ප්‍රාදේශීය පාලනය මධ්‍ය පාලනයෙන් බිඳීයාම.
- ආර්ථික පීඩනයකට පත්වීම. ( යුධ හමුදා නඩත්තු කිරීම, රාජ්‍ය නිලධාරීන්ට වේතන ගෙවීම,නව ජනාවාස ඇති කිරීම වැනි කටයුතු සඳහා රජයට විශාල මුදලක් වැය කිරීමට සිදුවීම. දුර්භික්ෂයක් ඇතිවීම.)

***(ලකුණු 08 යි)***

Department of Examinations - Sri Lanka

# C කොටස

**06. ඉන්දියානු ඉතිහාසයෙහිලා කුෂාණ යුගයේ වැදගත්කම පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ පරීක්ෂා කරන්න**

**(i) ආගම හා සාහිත්‍යය**
**(ii) කලා හා ගෘහනිර්මාණ ශිල්පය**

**(i) ආගම හා සාහිත්‍යය**

- කුෂාණ පාලකයෝ මහායාන බුදු දහමේ වර්ධනයට අනුග්‍රහ දැක්වූහ.
- හතරවන ධර්ම සංගායනාව වසුමිත්‍ර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පුරුෂපුරයේ කුණ්ඩලවන විහාරයේදී සිදු කිරීම. මේ සඳහා අශ්වඝෝෂ, පාර්ශව, වසුබන්ධු, සූර්යබන්ධු, ජිනබන්ධු, වැනි මහ තෙරවරු 500ක් සහභාගි වූහ.
- මහායාන බුදුදහම නිකාය 18කට බෙදී තිබූ අතර සංගායනාවේදී ඒවා විමර්ශනයට භාජනය කිරීම සිදු විය
- සංගායනාවෙන් පසු මහාවිභාෂා ( විනය විභාෂා, සූත්‍ර විභාෂා, අභිධර්ම විභාෂා )නමින් සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටකයට අටුවා ග්‍රන්ථ රචනා කිරීම හා ඒවා තඹපත්වල ලියා තැබීම.
- ජනතාව අතර මහායාන අදහස් ප්‍රචලිත කිරීම.
- ඉන්දියාවෙන් පිටතට බුදු දහම ව්‍යාප්ත කිරීම-. ( මධ්‍ය ආසියාව, චීනය. කොරියාව, හා ජපානය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මධ්‍ය ආසියාවේ යාර්කාණ්ඩ්, කෝටාන් හා නීය වැනි ස්ථානවල බෞද්ධ මධ්‍යස්ථාන බිහිවීම).
- හුවිෂ්ක පුරයේ ආරාමවල භික්ෂූණ් වහන්සේලා 5000ක් වැඩ සිටි බව සඳහන් වේ.
- බෝධිසත්ව සංකල්පය වර්ධනය වීම.
- දේවත්වය පිළිබඳ සංකල්පය වර්ධනය වීම.

<u>මෙකළ සාහිත්‍යයේ ද දියුණුවක් දක්නට ලැබුණි</u>

- අශ්වඝෝෂ, නාගර්ජුන, වසුමිත්‍ර, වසුබන්ධු, ආර්යදේව, සංඝමිත්‍ර, පාර්ශව, නාගර්ජුන වැනි අය සාහිත්‍යකරණයේ යෙදුණ අය විය.
- බෞද්ධ ග්‍රන්ථ රචනා කිරීම.
- දසභූමි, විභාෂා ශාස්ත්‍ර, සුහෘත්ලේඛා, විංසතිපඤ්ච පාරමිතා ටීකා ග්‍රන්ථය, බුද්ධ චරිතය, සූත්‍රාලංකාර ශාරිපුත්‍රකරණය, සෞන්දරානන්ද කාව්‍ය වැනි ග්‍රන්ථ රැසක් බිහිවිය.
- චරක සංහිතාව ආයුර්වේද ග්‍රන්ථය,චරක නාට්‍ය, ශුද්‍රකගේ මෘච්ඡකටිකා, භාසගේ සප්න දත්තා,
- සංස්කෘත භාෂාව දියුණු විය.
- මහායාන බෞද්ධ ග්‍රන්ථ චීන භාෂාවට පරිවර්ථනය කෙරිණ.

***(ලකුණු 08 යි)***



Department of Examinations - Sri Lanka

**(ii) කලා හා ගෘහනිර්මාණ ශිල්පය**

- ගාන්ධාර, මථුරා වැනි කලා සම්ප්‍රදායන් ඇතිවීම.
- කලාවට බටහිර ආභාසය ලැබීම.
- කණිෂ්ක, වශිෂ්ක, හා හුවිෂ්ක පාලන සමයේ බෞද්ධ ආගමික සිද්ධස්ථාන දියුණු වීම, බෞද්ධ ආගමික සිද්ධස්ථාන දියුණුවිය.
- බෞද්ධ ගොඩනැගිලි ඉදි කිරීම(විහාරාරාම, බෞද්ධ ස්තූප, -පෙෂවෝර් ධාතුමන්දිරය). කපීස නම් ස්ථානයේ ස්තූපයක් පැවතිනි. - හියුංසාන්.
- ධාතු මන්දිරයක් පැවති බවත් එය තමා දුටු බවත් පාහියන් ප්‍රකාශ කර ඇත. මෙය අගසිලවුන් නැමති ග්‍රීක ගෘහනිර්මාණ ශිල්පියෙකු කරන ලද්දකි.
- බුදු පිළිමය නිර්මාණය කිරීම,
- බෝධිසත්ව පිළිම නිර්මාණය
- ඉන්දු ග්‍රීක කලාව වර්ධනය වීම.
- මූර්ති හා කැටයම් කලාවේ වර්ධනයක් ඇතිවීම.

***(ලකුණු 08 යි )***

**07. " ගුප්ත අධිරාජ්‍ය සමය ඉන්දියානු ඉතිහාසයෙහි සම්භාව්‍ය අවධියක් ලෙස සලකනු ලැබේ"**

**(i) ගුප්ත යුගයේ නිල හා සාහිත්‍ය භාෂාව කුමක්ද?**

සංස්කෘත භාෂාව

***(ලකුණු 01යි)***

**(ii) ගුප්ත සමයේ පැවැති ප්‍රධාන හින්දු ආගමික ශාඛා දෙක නම් කරන්න.**

ශිව (ශෛව) හා විෂ්ණු (වෛශ්ණව)

***(ලකුණු 02යි)***

**(iii) ගුප්ත සමයේ කලා ක්ෂේත්‍රයන්හි සිදු වී ඇති වර්ධනය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න.**

- ➢ ඉන්දිය ඉතිහාසයේ විශිෂ්ටතම කලා නිර්මාණ හමුවන යුගයක් වීම.
- ➢ මෙකල කලාවේ වර්ගීකරණයක් දක්නට ලැබීම ( මූර්ති, කැටයම්, සිතුවම්)
- ➢ කලාත්මක නිර්මාණ දැකගත හැකි ස්ථාන ( අජන්තා, එල්ලෝරා, භාෂ්, සාරානාත් හා දියෝඝාර් දේවාලය

<u>මූර්ති කලාව</u>

- ➢ අග්‍රගණ්‍ය මූර්ති සාරානාත් ධර්ම චක්‍ර මුද්‍රාවෙන් යුතු හිදි පිළිමය, මථුරාවේ හිටි බුදු පිළිමය.
- ➢ රාමා සිතා අගස්ත්‍යය විෂ්ණු ශිව සත්ත්ව රූප වැනි විශාල මූර්ති සංඛ්‍යාවක් ලැබීම
- ➢ බෝධි සත්ත්ව ප්‍රතිමා හා දේව ප්‍රතිමා හමුවීම (කාසි, බුද්ධගයා, සාරානාත් )
- ➢ උපශාන්ත බව ස්ථායි බව හා සියුම් බව යන ලක්ෂණවලට මුල්තැන දෙමින් මූර්ති නිම කොට තිබීම.

<u>සිතුවම්</u>

- ➢ අජන්තා ලෙන් විහාර තුල ඇති සිතුවම් මගින් මෙම යුගයේ සිතුවම් කලාවේ විශිෂ්ටත්වය පෙන්නුම් කරයි
- ➢ කාලිදාසයන්ගේ කෘතිවල සදහන් වන ලාලිත්‍යය, සෞම්‍යභාවය, රිද්මය, ශෝභනත්වය සුන්දරත්වය මෙම චිත්‍රවල දක්නට ලැබීම
- ➢ පද්මපාණි බෝසතුන්ගේ සිතුවම, සද්දන්ත ජාතකය, යසෝදරාව හා රාහුල කුමරු බුදුන්වහන්සේ හමුවීම දැක්වෙන සිතුවම

<u>කැටයම්</u>

- ➢ ශිව පාර්වතී නිරූපිත කැටයම්
- ➢ රාජ් පුතානාවේ මන්දෝර්හි ක්‍රිෂ්ණ ගෝවර්ධන ධාරණ හා නාගගිරි දොර කැටයම්
- ➢ හිල්සා අසල උයදගිරි ලෙන් දොරෙහි නෙලා ඇති මහා වරාහාවතාර කැටයම්

***(ලකුණු 04)***

**(iv) ගුප්ත අධිරාජ්‍ය සමය ඉන්දියානු ඉතිහාසයේ සම්භාව්‍ය අවධියක් ලෙසට සැලකිය හැකි වන්නේ කවර හේතු නිසාදැයි පහදන්න.**

ගුප්ත යුගය සම්භාව්‍යය යුගයක් බවට පත් වූයේ එකල ශක්තිමත් ආණ්ඩුවක් මෙන්ම ආර්ථික ශක්තියද තිබූ හෙයිනි

- ✓ ගුප්තවරුන් යටතේ විශාල ප්‍රදේශයක පැතිරුණු අධිරාජ්‍යයක් තිබීම.
- ✓ එහි ඉතා කාර්යක්ෂම පාලනයක් පැවතීම
- ✓ වෙළද හා වාණිජ්‍ය අංශය දියුණුවට පත්ව තිබීම

➢ සම්භාව්‍යය යුගයක් ලෙස හදුනාගැනීම සදහා ඉහත සදහන් සමෘධිමත් තත්ත්වයට අමතරව තවත් සාධක හේතු වීම.

- ✓ පැරණි බ්‍රාහ්මණ ආගම නව ස්වරූපයක් ලබමින් වර්තමාන හින්දු ආගම ලෙස එය ඉදිරියට ඒම නිසා එහි පුනර්ජීවයක් ඇතිවීම (බ්‍රහ්ම, විෂ්ණු, මහේශ්වර වැනි දෙවිවරු ඉදිරියට ඒම) සහ ඒ හා බැදුනු සාහිත්‍ය වර්ධනය (පුරාණ ග්‍රන්ථ, විෂ්ණු ස්මෘති, රාමායණය, මහාභාරතය,මනුස්මෘතිය)
- ✓ ජෛනාගමට හා බුද්ධාගමට අනුග්‍රහය දැක්වීම (කුමාර ගුප්ත සමයේදී නාලන්දා විහාරස්ථානය පිහිටවීම)
- ✓ සංස්කෘත භාෂාවේ ඇති වූ වර්ධනය (රාජ්‍ය සභා නිල කටයුතුවලදී මෙන්ම ශාස්ත්‍රීය කටයුතුවලදීත් සංස්කෘත භාෂාව යොදා ගැනීම, සංස්කෘත භාෂා අධ්‍යයනයට රාජ්‍ය අනුග්‍රහය දක්වීම, සංස්කෘත භාෂාවෙන් ග්‍රන්ථ රැසක් රචනා කිරීම)
- ✓ මෙම යුගයේදී ආගම, දර්ශනය, ධර්ම ශාස්ත්‍ර, නාට්‍ය ශාස්ත්‍ර,ව්‍යාකරණ, ජ්‍යොතිශ, තර්ක ශාස්ත්‍ර, ගණිත, විද්‍යා, භූගෝලය, වෛද්‍ය ශාස්ත්‍ර වැනි විවිධ අංශ ඔස්සේ ග්‍රන්ථ රැසක් රචනා වීම. උගත් පඬිවරු රචිත ග්‍රන්ථ රැසක් ඇත.
  - නාට්‍යග්‍රන්ථ :- මාලවිකාග්නිමිත්‍ර, ශාකුන්තලය, වික්‍රමෞර්වශී (කාලිදාසගේ) මුද්‍රා රාක්ෂය, දේවිචන්ද්‍රගුප්ත (විශාඛදත්තගේ) මෘච්ඡකටික (ශුද්‍රකගේ)
  - කාව්‍යග්‍රන්ථ:රඝුවංශය,කුමාරසම්භවය,මේඝදූතය,ඍතුසංහාරය(කාලිදාසගේ)කිරාතාර්ජුණ, ශිශුපාලවධ, භාරවී (භාරවීගේ මහා කාව්‍ය) දශකුමාර චරිත (දණ්ඩීන්ගේ)

Department of Examinations - Sri Lanka

- ගද්‍ය කාව්‍යඃ වාසවදත්තා (සුබන්ධුගේ)
- වෛද්‍ය ග්‍රන්ථඃ අෂ්ටංගෘදය (වෘහද් වාග්භටගේ)
- ගණිතය හා තාරකා විද්‍යාවඃ ආර්යභට්ටිය, සූර්ය සිද්ධාන්තය (ආර්යභටගේ), බෘහත් සංහිතාව (වරාහ මිහිරගේ)
- අමරසිංහ රචිත අමරකෝෂ (සංස්කෘත භාෂාවේ ශබ්ද කෝෂයකි)
- ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථඃ කාත්‍යායන ධර්මසූත්‍රය, දේවාල ධර්මශාස්ත්‍ර
- අලහාබාද් ප්‍රශස්තිය සමුද්‍රගුප්ත රජුගේ රජවාසලේ කවියෙකු හරිසේන විසින් කරවන ලද්දකි)
- පංචතන්ත්‍රය හා හිතෝපදේශ මේ අවධියේදී සම්පාදනය කිරීම.
- භානබට්ටගේ හර්ෂචරිතය, කාදම්බරි.

✓ භාරවී, කාලිදාස, විශාකදත්ත , අමරසිංහ, භට්ට, ශුද්‍රක, භාස ගුප්ත යුගයේ සිටි ගත් කතුවරු කීපදෙනෙකි.

✓ නවරත්න කවීන් දෙවන චන්ද්‍ර ගුප්ත රාජසභාවේ සිටීම (ධන්වන්තරී, ක්ෂපණක, අමරසිංහ, ශංකු, වේතාලභට්ට, ඝටකර්පර, කාලිදාස, වරාමිහිර, වරරුචි )

✓ උසස් අධ්‍යාපනයක් ලබාදීමට පාලකයන් ක්‍රියා කිරීම.

➢ ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව හා චිත්‍ර කලාව

✓ බෞද්ධ, හින්දු ලෙන් විහාර ඉදිකිරීම. - විහාර හා චෛත්‍ය ශාලා (නාලන්දා,අජන්තා, එල්ලෝරා, අවුරංගාබාද්,භාග්,උදයගිරි, දියෝඝාර්හි විෂ්ණු දේවාලය, භිතර්ගම්හි දේවාලය,

✓ බෞද්ධ ස්තූප ඉදි කිරීම.( සාරානාත්හි ධාමෙක් ස්තූපය, සින්ධ්හි මීරුපූර් ස්තූපය)

✓ බෞද්ධ හා හින්දු ප්‍රතිමා (සාරානාත් හිඳි පිළිමය, මථුරාවේ හිටි බුදු පිළිමය,බෙනාරස්, දියෝගාර්)

✓ අජන්තා බිතු සිතුවම්, බාඝ් ගුහාවල චිත්‍ර.

✓ දිල්ලියේ මෙහ්රෞලීහි යකඩ ස්තම්භය

✓ තඹ ප්‍රතිමා ( නාලන්දාවේ ඇති මීටර් 25 ක් උස බුද්ධ රූපය)

✓ චෛත්‍යශාලා

***(ලකුණු 09 යි)***

**08. "හර්ෂ දක්ෂ සටන්කාමියෙකු මෙන්ම හොඳ පරිපාලකයෙක් ද විය." මෙම ප්‍රකාශය පහත සඳහන් තේමා යටතේ සාකච්ඡා කරන්න.**

**(i) උතුරු ඉන්දියාවේ අධිරාජ්‍යයක් පිහිටුවීම.**

**(ii) හර්ෂ රජුගේ සමාජ හා ආගමික කටයුතු**

**(i) ´උතුරු ඉන්දියාවේ අධිරාජ්‍යයක් පිහිටුවීම**

- ක්‍රි.ව. 606දී පුෂ්‍යභූති රාජවංශයට අයත් හර්ෂවර්ධන ථානේශ්වරය හා කනෞජය යන රාජධානි දෙකේ රජකමට පත්විය.
- හර්ෂ වර්ෂය ආරම්භ වූයේ මෙතැන් සිටයි.
- රජු ගැන තොරතුරු සපයන ප්‍රධාන මූලාශ්‍රය භාණබට්ටගේ හර්ෂචරිතයයි.
- ගුප්ත යුගයෙන් පසු උතුරු ඉන්දියාව එක්සත් කළ අවසාන හින්දු පාලකයාය.
- හර්ෂ සිය අගනුවර කන්‍යාකුබ්ජ හෙවත් කනෞජ් නගරයට මාරු කිරීම
- හර්ෂවර්ධන "රාජ්පුත් " විරුදය සහිතව අභිෂේක ලැබීම.
- තම සොහොයුරිය සොයා ගෙන ඇයට රාජ්‍ය භාරදීම හා ඇය එය ප්‍රතික්ෂේප කිරීම. (තම සොහොයුරිය රාජ්‍ය ශ්‍රී කුමරිය සෙවීම සඳහා වින්ධ්‍යව තෙක් ගිය ගමනේදී පසු කළ රාජ්‍යයන්හි පාලකයන් යටත් රජුන් බවට ද එම රාජ්‍යයන් අවනත රාජ්‍යයන් බවට ද පත් කර ගත්තේය.)

***(ලකුණු 08 යි)***



Department of Examinations - Sri Lanka

### (ii) හර්ෂ රජුගේ සමාජ හා ආගමික කටයුතු

**හර්ෂවර්ධනගේ දිග්විජය ව්‍යාපාරය**

- මේ පිළිබඳව හියුංසාං කරුණු ඉදිරිපත් කර ඇත. නමුත් ඔහුගේ දිග්විජය පිළිබඳව කිසිවක් සඳහන් නොවේ.
- ගෞඩ දේශයේ සසංකට එරෙහිව පළමු දිග්විජය ව්‍යාපාරය ආරම්භ කිරීම.

**යුධ ව්‍යාපාර**

- වළභි හා ගුර්ජර පාලකයන් සමග සටන් කිරීම.
- වළභිය ජයග්‍රහණය කර වළභි පාලක ද්‍රුවසේනට හර්ෂගේ දියණිය විවාහ කර දීම.
- ගුර්ජර ප්‍රදේශය ආක්‍රමණය කිරීම. වළභි පාලකයා මැදිහත්වී ගුර්ජර පාලකයා බේරා ගත් බව බ්‍රෝච් ශිලා ලිපියේ සඳහන් වේ.
- චාලුක්‍ය වංශික දෙවන පුලකේශීන් සමග සටන් කිරීම. ( හර්ෂවර්ධන පරාජය වූ බව අයිහෝලේ ලිපියේ සඳහන් වේ. හර්ෂවර්ධනගේ රාජ්‍යයේ දකුණු සීමාව නර්මදා නදිය බවට පත්වීම ).
- සින්දු ප්‍රදේශය ආක්‍රමණය කිරීම. මෙය ජයග්‍රහණය කළ බව භානභට්ට සඳහන් කර ඇත.
- නැගෙනහිර ආක්‍රමණය කිරීම- ඇසෑම් පාලකයාගේ සහාය ලැබීම
- අවුද්, කොංගෝදා, ඔරිස්සා හා බෙංගාලය ආක්‍රමණ කිරීම.
- උතුරු ඉන්දියාවේ සමකාලීන සියලු පාලකයන් හර්ෂගේ රාජ්‍යය ප්‍රමුඛත්වයේ ලා සැලකීම
- අභිලේඛනවල හර්ෂ "සකල උත්තරාපථනාථ" යනුවෙන් හඳුන්වා ඇත.
- එහෙත් ඔහුගේ රාජ්‍යය එතරම් විශාල නොවීය.

හර්ෂ කාරුණික පාලකයෙකි. පරිපාලනයේ දක්ෂයෙකි. තමා විසින්ම පරිපාලනය කරන ලද බව හියුංසාං පවසයි. මන්ත්‍රී පර්ශද් (ඇමති මණ්ඩලය) සහාය වූ බව සිතිය හැකිය.
ප්‍රත්‍යන්ත ප්‍රදේශ, පරිපාලකයන් හෝ තිලකාර රාජ්‍යයන් විසින් හෝ පාලනය කිරීම.
රාජකාරි සංස්ථාව කාර්යක්ෂම ලෙස සංවිධානය කෙරිණි. ඒවා භුක්ති (දේශ) හා විෂයයන්ට (පළාත්වලට) බෙදීම. ග්‍රාමය පහළම පරිපාලන ඒකකය විය.
සුළු වශයෙන් බදු අය කෙරිණි.
දණ්ඩන නීති දරුණු විය. (ජීවිතාන්තය දක්වා සිරගෙයි ලෑම, පිටුවහල් කිරීම, අත්පා සිඳීම වැනි දඬුවම් ක්‍රියාත්මක කළේය.)

**සමාජ හා ආගමික කටයුතු**

- ආගමික වර්ධනයට අනුග්‍රහ දැක්වීම.
- බුද්ධාගමට, වෙනත් ආගම් හා නිකායන්වලට අනුග්‍රහ දැක්වීම.
- ආගමික සම්මේලන පැවැත්වීම. (- කනෞජ සම්මේලනය )ඇතෙකු පිට තබා රුවන්මුවා බුදු පිළිම වහන්සේ පෙරහරකින් වැඩම කරවීම , පුදපූජා පවත්වා දානයක් දීම, -මෙය කනෞජයේ පැවතිණි.
- ප්‍රයාගයේ පංචවාර්ෂික මහාදානය පැවැත්වීම. ( මෝක්ෂද් පර්ෂද )
- හර්ෂ ශිව භක්තිකයෙකු විය. බුදු දහම කෙරේ බැඳීමක් ඇති වූයේ රාජ්‍ය ශ්‍රී බිසව නිසාය.
- අවුරුදු පතා බෞද්ධ සංගායනාවක් පැවැත්විය.
- සමාජ යහපතට වැඩ කළේය.
- සතුන් මැරීම තහනම් කළේය.
- දිළින්දන්ට හා අසරණයන්ට නොමිලයේ ආහාර හා බෙහෙත් ලබා දුන්නේය.
- උගතුන්ට හා සාහිත්‍යකරුවන්ට අනුග්‍රහ දැක්විය.
- ආදායමෙන් ¼ ක් ලේඛකයන්ට පිරිනැමීය.
- හර්ෂචරිතය, කාදම්බරි වැනි කෘති බිහිවීය. (භාණබට්ට රචිත)
- හර්ෂ ද කවියෙක් බව සඳහන් වේ.
- රජු ද ග්‍රන්ථකරණයේ යෙදීම. (රත්නාවලි, ප්‍රියදර්ශිකා, නාගානන්ද)
- නාලන්දා, වලභි, තක්ෂලා වැනි අධ්‍යාපන ආයතනවලට අනුග්‍රහ දැක්විය.

***(ලකුණු 08 යි)***

Department of Examinations - Sri Lanka

**09. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් <u>දෙකක</u> ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.**

**(i) හියුංසාං**

- ඉන්දියා ඉතිහාසය ගැන වැදගත්ම සටහන් ලියූ චීන ලේඛකයා හියුංසාං හිමි ය.
- භාරත ඉතිහාසයේ අඳුරු කාල පරිච්ඡේද කීපයකටම ආලෝකය ලබාගත හැක්කේ හියුංසාංගේ භ්‍රමණවෘත්තාන්තයෙන් යැයි වින්සන්ට් ස්මිත් ප්‍රකාශ කර ඇත.
- ක්‍රි. ව. 603 දී චීනයේ හෝනං ප්‍රදේශයේ චිං ලිවු නගරයේ උපත ලද මෙතුමා ක්‍රි. ව. 629 දී ඉන්දියාවට පැමිණීමට පිටත්විය.
- මධ්‍ය ආසියාව හරහා දුෂ්කර ගමනක යෙදී මුලින්ම ඉන්දියාවේ ගාන්ධාරයට පැමිණියේය.
- මෙතුමා ඉන්දියාවේ අවුරුදු 16 ක් ගත කර ක්‍රි. ව. 646 දී ආපසු සිය දේශයට ගොස් ඇති අතර ක්‍රි. ව. 664 දී මිය ගියේය.
- චීනයට ගිය පසු සිය අත්දැකීම් ඇසුරෙන් භ්‍රමණවෘත්තාන්තය රචනා කර ඇත.
- තක්ෂිලා, සිංහපුර, කාශ්මීරය, සාගල, ජලන්ධාරය, මථුරා, කනෞජ්ය, අයෝධ්‍යා, ප්‍රයාග, කෞසම්බි, ශ්‍රාවස්ති, වජ්ජි, කාංචිපුරය, බදාමිය වැනි ස්ථාන රැසක් ගැන තොරතුරු සඳහන් කර ඇත.
- හර්ෂවර්ධන රජතුමා පැවැත් වූ ආගමික පෙරහැර හා කනෞජ් සම්මේලනයට සහභාගී වී ඇති අතර ඒ ගැන වර්ණනා විස්තරයක් ඉදිරිපත් කර ඇත.
- නාලන්දා විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ උන් වහන්සේ එම විශ්වවිද්‍යාලය පිළිබඳ බොහෝ තොරතුරු දක්වා ඇත. (ඉගැන් වූ විෂය ක්ෂෙත්‍රය, ඉගැන්වීම් ක්‍රමවේදය)
- ක්‍රි. ව. 641 දී ඩෙකානයේ චාලුක්‍ය වංශික දෙවන පුලකේශීන්ගේ මාළිගාවට ගොස් ඇත.
- කාංචිපුරයට උන් වහන්සේ පැමිණි අවස්ථාවේ සියැසින් දුටු බෞද්ධ විහාරාරාම සීයයකට වැඩි ගණනක භික්ෂූන් වහන්සේලා දසදහසකට වැඩි සංඛ්‍යාවක් සිටි බව ද වාර්තා කර ඇත.
- මිහරකුලගේ ආක්‍රමණය, ධර්මාශෝක හා කනිෂ්ක යන රාජවරු පිළිබඳව ද සවිස්තර තොරතුරු වාර්තාගත කර ඇත.
- ඒ වගේම මෙතුමා සමකාලීන ඉන්දියානු සමාජය ගැන ද විස්තර කරයි. ( චාතුර් වර්ණණය, මළවුන් ආදාහනය ක්‍රම, නීතිය ක්‍රියාත්මක කළ අන්දම, වැසියන්ගේ ජීවන තත්ත්වය, ආහාර රටාව, ගනුදෙනු ක්‍රම, සූර්ය වන්දනය, ආගමික පසුබිම, අධ්‍යාපනය, විවිධ වෘත්තීන් )
- එතුමා ඉන්දියාවෙන් යනවිට බෞද්ධ ග්‍රන්ථ ( හස්ත ලිඛිත ග්‍රන්ථ ) 657 ක් ද, බොහෝ සර්වඥ ධාතූන් වහන්සේලා ද, රන් රිදී පලිගුවලින් හා සඳුනෙන් කළ බුදු පිළිම හා රහත් පිළිම රැසක් රැගෙන ගියේය.
- හර්ෂවර්ධන රජතුමා වටිනා පරිත්‍යාග රැසක් ලබා දුන්න ද එයින් ලබා ගෙන ඇත්තේ පෞද්ගලික වියදමට මුදල් ටිකක් හා ලොම්මුවා කබායක් පමණි.
- උන් වහන්සේ ඉන්දියාවට පැමිණීමේ අරමුණ ලෙස දක්වා ඇත්තේ සම්බුද්ධ ධර්මය ඉගෙනීම හා තථාගතයන් වහන්සේගේ පාදානුහරනය කිරීමට ය.

***(ලකුණු 08යි)***



Department of Examinations - Sri Lanka

**(ii) ත්‍රිකෝණ අරගලය**

- හර්ෂවර්ධන රජුගේ මරණයෙන් පසු උතුරු ඉන්දියාවේ ආධිපත්‍ය උදෙසා ප්‍රධාන වශයෙන් රාජවංශ තුනක් අතර ඇති වූ බල අරගල ත්‍රිකෝණ අරගලය ලෙස හැඳින්වීම.
- බටහිර ඉන්දියාවේ රාජපුතානාහි ගුර්ජර ප්‍රතිහාර, බෙංගාලයේ පාල හා බටහිර ඩෙකානයේ මහාරාෂ්ට්‍රයේ රාෂ්ට්‍රකූට යන රාජ්‍ය තුන අතර ගැටීම.
- හර්ෂවර්ධන රාජ්‍ය සමයේදී උතුරු ඉන්දියාවේ බල කේන්ද්‍රස්ථානය බවට කනෞජය පත්වීම නිසා මේ රාජ්‍යයන් කනෞජයේ ආධිපත්‍යය වෙනුවෙන් යුද්ධ කරන ලද්දේ කනෞජය දිනාගැනීම උතුරු ඉන්දිය දේශපාලන ආධිපත්‍යයේ සංකේතයක් බවට පත්ව තිබීමය.
- ගුර්ජර ප්‍රතිහාර පාලක වත්සරාජ විසින් පාල වංශික ධර්මපාල ද පරාජය කරමින් නැගෙනහිර බලය පතුරුවාලීමට උත්සාහ කරන අතර රාෂ්ටකූට පාලක ධ්‍රැව රජු ඔහු පරාජය කොට රාජපුතානා කාන්තාරය දෙසට පලවා හැරීම.
- මේ නිසා ධර්මපාල රජුට ගුර්ජර ප්‍රතිහාර පහරදීම්වලින් වැළකී තම බලය බටහිර දෙසට පතුරුවා ගැනීමට හැකි විය.
- එහෙත් රාෂ්ටකූට පාලක ධ්‍රැව බෙංගාලය ආක්‍රමණය කොට ධර්මපාල රජු පරාජය කළ ද ධ්‍රැවට හදිසියේ ආපසු යෑමට සිදුවීමෙන් කනෞජය අල්ලාගත් ධර්මපාල රජු ප්‍රතිහාරයන්ට යටත්ව සිටි ඉන්ද්‍රායුධ ඉවත් කොට තමාට අවනත චක්‍රායුධ එහි පාලකයා බවට පත් කිරීම.
- ගුර්ජර ප්‍රතිහාර පාලක දෙවන නාගභට (වත්සරාජගේ පුත්‍රයා) ප්‍රතිහාර බලය නැවත පිහිටුවීමට දරූ උත්සාහයේදී ධර්මපාල රජු පරාජය කිරීම.
- එහෙත් රාෂ්ටකූට පාලක තුන්වන ගෝවින්ද උතුරු ප්‍රදේශය ආක්‍රමණය කොට නාගභට පරාජය කිරීම සමත් විය. නමුත් ජයග්‍රහණය තහවුරු කර ගැනීමට පෙර ගෝවින්ද රජුට ආපසු යෑමට සිදුවීම නිසා එය ධර්මපාල රජුට වාසිදායක වීම.
- ධර්මපාල පුත් දේවපාල රජු ද උතුරු ඉන්දියාවේ බලය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
- එහෙත් දේවපාලගෙන් පසු පාල වංශික දුර්වල පාලකයන් රජකම් දැරීම නිසා භෝජ රජු යටතේ ගුර්ජර ප්‍රතිහාර නැගී එමක් සිදු වීම.
- ගුර්ජර ප්‍රතිහාර පාලක භෝජ රජු ද සටන් ගෙන යමින් උතුරු ඉන්දියාවේ අධිරාජ්‍ය බලය අල්ලා ගැනීමට ක්‍රියා කිරීම.
- අවසානයේදී මෙම රාජ්‍ය තුනම දුර්වල වී ඒවායේ බලය වෙනත් කණ්ඩායම් දිනා ගැනීම.

*(ලකුණු 08 යි)*

**(iii). චෝළයන්ගේ ප්‍රදේශීය පාලනය**

- චෝල පාලනයේ ප්‍රාදේශීය පාලනය කැපී පෙනෙන අංශයක් වීම.
- ප්‍රාදේශීය පාලනයේදී චෝළ අධිරාජ්‍යය මණ්ඩලවලට බෙදා තිබිණි.
- එවැනි මණ්ඩල ගණන ඇතැම් විට 6 ක් වූ අතර ඇතැම් විට 8 ක් ද වී ඇත. චෝළ අධිරාජ්‍යය ඉතා විශාල අවධියේදී මණ්ඩල ගණන 9ක් විය. ( පාණ්ඩ්‍ය මණ්ඩලම්, චෝළ මණ්ඩලම්, මලයිනාඩු මණ්ඩලම්, කොංගු මණ්ඩලම්, මුම්මුඩිචෝල මණ්ඩලම් )
- චෝළ මණ්ඩලම් හැර අනෙකුත් මණ්ඩලම් පාලනය කරන ලද ප්‍රාදේශීය පාලකයන් ලෙස බොහෝදුරට කටයුතු කළේ රාජකුමාරවරුන්, රජපවුලේ පිරිස් ය.
- මණ්ඩලම්හි පාලකයන්ට යුධ හමුදාවක් සිටීම.
- මණ්ඩලම් නැවත වලනාඩු (කොට්ටම්),නම් ඒකකවලටද නාඩු, කුර්රම් නම් කොටස්වලට බෙදා තිබීම.
- මෙම පාලන ඒකක භාර නිලධාරීන් යටතේ විවිධ සේවා භාර නිලධාරීන් සමූහයක් විය.
- චෝළ ප්‍රාදේශීය පාලනයේ ඉතා වැදගත් පාලන ඒකකය වූයේ ගමයි.
- උත්තරමේරූ ශිලාලිපියෙන් ග්‍රාම පාලනය පිළිබඳ වැදගත් තොරතුරු හමුවේ.
- ග්‍රාම පාලනයේදී "ඌර් " සහ " සභා " නමින් ආයතන දෙකක් විය.
- ගම් කිහිපයක් එකතු කර " මහසභාව " සකස් විය.
- ඒ අනුව මහසභාව ඌර් ( ගමක අයබදු ගෙවන ගම්වැසියන්ගෙන්), සභාව (බ්‍රාහ්මදේය ගම්වල වැසියන්) හා නගරම් ( වෙළෙඳ මධ්‍යස්ථානවල වූ නගරම් සමාගම )යන කොටස් තුනකට බෙදා තිබිණි.

Department of Examinations - Sri Lanka

- ➢ නිලධාරීන් තෝරා ගනු ලබන්නේ ගමක් කොටස් තිහකට බෙදා එහි සුදුසුකම් ලද්දන් අතුරින් කුසපත් ඇදීමේ ක්‍රමයට හෝ මාරුවෙන් මාරුවටය. වංක හා දූෂිත පුද්ගලයින්ට තනතුරු හිමි නො විය.
- ➢ ගම් පාලනය සඳහා ග්‍රාමකෝය, මුක්ත, ග්‍රාම මණ්ඩල, වාරියම් නමින් හැඳින්වෙන කාරක සභා පැවතිණි.
- ➢ මහාසභාව වාරියම් නමින් හැඳින්වෙන කාරක සභාවලට(කමිටු)බෙදා ඒවාට සේවාවන් පැවරීම.
- ➢ උත්තරමේරූ ශිලාලිපියට අනුව එහි වාරියම් 5කට බෙදා තිබිණි. (ගෙවතු පිළිබඳ කමිටුව, වාරිමාර්ග කමිටුව, වාර්ෂික කමිටුව, රන් කමිටුව, පංචවාර කමිටුව)
- ➢ මහසභාව මගින් ගම වෙනුවෙන් විශාල වගකීම් කොටසක් ඉටුකිරීමට බැඳී සිටී. ( ඉඩම් වගා කරවීම, ජලසම්පාදනය, සෞඛ්‍ය කටයුතු, මාර්ග ඉදිකිරීම, අධ්‍යාපනය, ආගමික කටයුතු, බදු එකතු කිරීම, නඩුවිසඳීම)
- ➢ ගම්සභාව සතු වගකීම් හා බලතල ක්‍රියාත්මක කිරීමේදී කමිටුවල සභයට වැටුප් ලබන ස්ථිර නිලධාරී පිරිසක් විය.
- ➢ ගම්සභා පාලනය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මකවීම නිසා මධ්‍යම ආණ්ඩුවේ බලය දුර්වල වුවත් ගම්සභා පාලනය හොඳින් පැවතිම විශේෂ ලක්ෂණයකි.

***(ලකුණු 08 යි)***

**(iv) පාල රාජවංශය**

- සසංකගෙන් පසු බෙංගාලයේ දේශපාලන බලය දුර්වල වෙමින් කුඩා රාජ්‍ය ගණනාවක් ඇතිවීම.
- බෙංගාලයේ නැවත දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනැගෙන්නේ පාල වංශික පාලකයන් යටතේ ය.
- පාල රාජ වංශයේ කැපීපෙනෙන පාලකයන් වූයේ ගෝපාල, ධර්මපාල, දේවපාල, මහීපාල යන රජවරු ය.
- රදලයන් විසින් රජු ලෙස ගෝපාල පත් කර ගැනීමෙන් පසු ඔහු මුලු බෙංගාලයම එකම පාලනයක් යටතට ගැනීමට සමත් විය.
- ගෝපාල රජු ඇවෑමෙන් රජ පැමිණි ධර්මපාල රජු පාල රාජ වංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා ය.
- ගුර්ජර ප්‍රතිහාර (වත්සරාජ, දෙවන නාගභට ) හා රාෂ්ටකූටයන් (ධ්‍රැව, තුන්වන ගෝවින්ද ) සමග කළ සටන්වලින් ධර්මපාල රජු පරාජය වුවද ජයග්‍රාහකයන් මුහුණ දුන් ප්‍රශ්න නිසා ඔවුන්ට සිය ජයග්‍රහණය තහවුරරු කර ගැනීමට අපොහොසත්වීම නිසා ධර්මපාල රජුට වාසිදායකවීම.
- කනෞජය ජයගැනීම. එහිදි කනෞජ් පාලක ඉන්ද්‍රායුධ පැරදවීම හා චක්‍රායුධ සිහසුනේ තැබීම.
- උතුරු ඉන්දියානු රජවරු කීපදෙනෙක්ම චක්‍රව ධර්මපාල රජුගේ ආධිපත්‍යය පිළිගැනීම. ( භෝජ, මත්ස්‍ය, කුරු, අවන්ති)
- බෙංගාලය උතුරු ඉන්දියාවේ බලවත් රාජ්‍ය බවට පත් කළ ධර්මපාල රජු පරමේෂ්වර, පරම භට්ටාරක, මහාරාධිරාජ යන විරුද නාමයන්ගෙන් හැඳින්වීම.
- ඔහුගෙන් පසු සිහසුනට පත් වූ පුත් දේවපාල කුමරු ද රාජ්‍යයේ බලය වර්ධනය කර ගැනීමට කටයුතු කිරීම.( වින්ධ්‍ය හා කාම්බෝජය දක්වා ජයගැනීම)
- ගුජරාට (ප්‍රතිහාර) උස්කලා (ඔරිස්සා) ඇසෑම් යන ප්‍රදේශවලට එරෙහිව ජයග්‍රහී සටන් මෙහෙයවීම.
- හූනයින් පරාජය කිරීම.
- දේවපාලගෙන් පසු දුර්වල පාලකයන් කීපදෙනෙක්ම පාලනය කළ පසු රජ වූ මහීපාල රජු බෙංගාලයේ බලය නැවත නගා සිටුවීමට ක්‍රියාකිරීම,
- මොහුගෙන් පසු බෙංගාලයේ බලය දුර්වලවීම.

- පාල රජවරු බුද්ධාගමට අනුග්‍රහ දැක්වීම ( ටිබෙට් වාර්තා අනුව ධර්මපාල රජු බෞද්ධාගමේ ශ්‍රේෂ්ඨ අනුග්‍රාහකයෙකුවීම.
- අධ්‍යාපන ආයතන පිහිටුවීම, (ධර්මපාල රජු විසින් වික්‍රමශිලා, ඕදන්තපුර්, බුද්ධ ධර්මය හැදෑරීමට ආයතන 50 කට වඩා පිහිටුවීම)
- බෞද්ධ විහාරස්ථාන ඉදිකිරීම. (වරේන්දිහි සෝමපූරි විහාරය)
- විදේශ බෞද්ධ රටවල් සමග සම්බන්දතා ඇති කරගැනීම. (සුමාත්‍රාවේ ශෛලේන්ද්‍ර රාජවංශය)
- සුමාත්‍රාවේ ශෛලේන්ද්‍ර රජු වූ බාලදේවපුත්‍ර නාලන්දා විහාරයට අනුග්‍රහ දැක්වීම.
- මහායාන බෞද්ධ කතුවරයෙකු වූ හරිභද්‍රට අනුග්‍රහ දැක්වීම.
- කලා ශිල්ප වර්ධනයට අනුග්‍රහ දැක්වීම.

***(ලකුණු 08යි.)***



Department of Examinations - Sri Lanka